භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2021 මාර්තු - අප්‍රේල් | 122 වන කාණ්ඩය - 01 කලාපය | පිටු 32 | QD/81/පුවත්/2021



## පොරොන්දු විජිතයේ හිමිකම් ලද්දෙමු !

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# ජීවිතය නම් කිමැයි......

පද රචනය - මහාචාර්ය කුලරත්න ආරියවංශ
තනු නිර්මාණය - ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය - සුනිල් එදිරිසිංහ

පුනගැයුම :

ජීවිතය නම් කිමැයි කියා දෙන්නේ ඔබයි
අනුන් සෙත උදෙසා තමන් සුව නොතකා
දිවිය කැප කළ උතුම් මිනිසුනි
මිනිස්කම නම් කිමැයි
කියා දෙන්නේ ඔබයි...

ඉසුරු සුව රස පහස හැරදා
කටුක දුක රුපු ගැහැට වළඳා
සියල් සත වෙත පතළ කුළුණින්
ලොව පහන් පියසක් කරන්නට
ජීවිතය පුද දුන් ඒ උතුම් මිනිසුන්...

පෙළෙන සිත් තුළ නැගෙන සුසුමන්
දැවෙන නෙත් අග කෙවෙන කඳුලැල්
දැනී කම්පිත සිතින් නැගෙමින්
මිනිස් මහිමය හෙළි කරන්නට
ඥානනය ලැබ දුන් ඒ උතුම් මිනිසුන්...

ජීවිතය නම් කිමැයි...



කුලරත්න ආරියවංශයන්ගේ මනෝහර තෙලිතුඩින් නිමැවී, රෝහණ වීරසිංහයන්ගේ මධුර සංගීතයෙන් හැඩවී, සුනිල් එදිරිසිංහයන්ගේ හෘදයංගම හඬින් ගැයෙනා "ජීවිතය නම් කිමැයි" ගීතය වනාහි ලෝ සතට ජීවිතයේ අරුත සහ මනුසත්කමේ මහිම කියා දුන් උදාර මිනිසුන් වෙනුවෙන් පිදූ උපහාරයක් මැයි.

තමන්ට යැයි තබා නොගෙන වැසි වස්වන අහස්කුස මෙන්, "තමන් සුව නොතකා අනුන් සෙත උදෙසා" ක්‍රියා කරන පරාර්ථකාමී ශ්‍රේෂ්ඨ පුද්ගලයෝ කොපමණ නම් වේද? ජීවිතයට නිවහන වූ අම්මාත්, නිහඬවම කැපකිරීම් කළ තාත්තාත්, මා වෙනුවෙන් "කටුක දුක රුපු ගැහැට" වැළඳුවන්ගෙන් ප්‍රථමයෝ වෙති. ඉන්පසු, ජීවිතය සවි කරන්නට සහාය වූ ගුරු භවතුන්, පැවිදිවරුන්, පැවිදිවරියන්, වෙදැදුරන් ආදි මනුසත්කමින් පොහොසත් වූ විපුල දනෝ බොහෝ වෙති.

මිනිස්කමේ මහිමය කියා දුන් අග්‍රගන්‍ය ලෝ ප්‍රකට චරිත කිහිපයක්ද සිහියට නගාලීමට පවා කුලරත්න ආරියවංශයන්ගේ සුගම පද වැල් සමත් විය. වර්ණ භේදයට විරුද්ධව සටන් කළ මාටින් ලූතර් කිං, පලිගැනීම වෙනුවට සමාවදීම පරමාදර්ශය කරගත් නෙල්සන් මැන්ඩෙලා, වීදි සරන අසරණුන්ට පිළිසරණ වූ කල්කටාවේ තෙරේසා මවුතුමිය වැන්නවුන්, "ලොව පහන් පියසක්" කළ අපේ කාලයේ වීරයෝ නොවන්නෝද?

ලොවට එකලෙස ආදරය කළ හැකිනම්, ස්වාර්ථය වෙනුවට පරාර්ථයෙන් කටයුතු කළ හැකිනම්, එතැන ඇත්තේ මනුෂ්‍යත්වය යි. එවන්වූ මනුෂ්‍යත්වයේ ගුණ සුවඳ තම කෙටි ජීවිත කාලය තුළ විහිදුවා හැර අනාගත පරපුරට ඥාණනය ලැබදුන් සහසකුත් උත්තුංග මිනිසුන් හට මේ කෙටි සටහන උපහාරයක්ම වේවා!

ගරු ශානිල් දිනුක ජයවර්ධන
(නි.ම.නි.) පියතුමා
රෝමයේ සිට

# භක්ති ප්‍රබෝධනය

2021 මාර්තු - අප්‍රේල් කලාපය


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි.

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී සුනිල් ප්‍රනාන්දු
ෆිලීෂන් අබයකෝන්

**මුද්‍රණ සැලසුම හා කවර නිර්මාණය**

අචල රූපසිංහ

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 නික්මයාමේ අධ්‍යාත්මය
- ගරු ජීවන්ත පීරිස් පියතුමා

7 දෙවියන් සහ සාතන් - සපුගස්කන්දේ රංජිත්

8 කුරුසියෙන් තොර උත්ථානයක් නොමැත
- වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්

10 පාළුකරයේ බලාපොරොත්තුව
- නිර්මාල් අශාන් තෝනිස්

11 චුට්ටා
- ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා

12 අපත් රටත් ලොවත්...
- මහින්ද නාමල්

16 විමුක්තියේ දෝංකාරයයි එය...
- තරංගනී රෙසිකා ප්‍රනාන්දු

17 පාළුකරයේ බලාපොරොත්තුව
- ගංගා රුවන්ති රූපසිංහ
අමිතගේ හද ගැස්ම - සී. අමිත

18 ශුද්ධ වූ සතිය අර්ථවත් කරමු
- ජූඩ් රවීන්ද්‍ර විනයසිරි

22 ලොතරැයියක් වූ තලෙන්තු
- රොඩ්නි වර්ණකුල
පොරොන්දු විජිතයේ හිමිකම් ලද්දෙමු
- බෙනඩික් විජේසිංහ

23 පාස්කුව සහ සිංහල/දෙමළ අලුත් අවුරුද්ද
- ගරු ඩී. එෆ්. මැදගොඩ පියතුමා

24 ඕං එහෙනං - ජෝසප් ඩයස්

26 පුංචි විකුම් - සූරිය මාමා

27 ප්‍රහේලිකා අංක - 62
- ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

28 කතෝලික ධර්මය අ.පො.ස. (සා./පෙළ) විභාගය 2021 ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I කොටස
- ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.

30 අ.පො.ස. (උ./පෙළ) ක්‍රිස්තියානි ධර්මය විශ්ව සහා ඉතිහාසය II - එස්. හේමාල් පෙරේරා

භක්ති ප්‍රබෝධනය

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාවයි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළවන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




**කවරයේ කථාව**

පාරවෝ රජවරුන් යටතේ මිසරයේ ජුදා ජනතාව වහල් ජීවිතයක් ගත කළෝය. මෝසෙස්ගේ නායකත්වය තුළ නික්මයාමේ විමුක්ති ගමන මේ වහල් ජනතාව අරඹන්නේ එයින් මිදෙන්නටය. පුරාණ ගිවිසුමේ පොරොන්දු දේශය නව ගිවිසුමේ පාස්කු අභිරහස තුළ පරිපූර්ණ වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ සේවක, නිහතමානි, යහපත් එඬේරාණන්ගේ ප්‍රතිරූපය දරන නායකත්වය හරහාය. යමෙක් නායකයෙක් වියයුතුනම් හෙතෙම සේවකයකු විය යුතු බව ක්‍රිස්තුන් වහන්සේ අවධාරණය කළ සේක. ක්‍රිස්තුන් වහන්සේ සේවකයකුගේ, ස්වරූපය ගෙන ජීවත්වීම මහ බ්‍රහස්පතින්දා ශ්‍රාවකයන්ගේ පාද ධෝවනය හරහා උච්චතම අවස්ථාවට පැමිණුනි. ක්‍රිස්තු රජාණන්ගේ නායකත්වය ලෝකයේ රජවරුන්ට සහ ජනතා නායකත්වයට පැමිණෙන කවරෙකුට හෝ අභියෝගයකි. ලෝකයේ කවර රටක නායකත්වයට කවරෙකු පත් වුවද බොහෝ අවස්ථාවල එම නායකත්වයන් හා ක්‍රිස්තු නායකත්වය එකිනෙකට ප්‍රතිවිරුද්ධ ස්වාභාවයක් ගනියි. ක්‍රිස්තු නායකත්වය පරමාදර්ශය කරගත් නායකත්වය තුළ ජනතාව සතුටින් නිදහස්ව ජීවත් වෙති. ජනතාව සැබෑ විමුක්තිය ලබති. පිරමීඩයක හැඩය උඩු යටිකුරු කර පෙන්වන්නේ ක්‍රිස්තු රජාණන්ගේ නායකත්වය ලෝකයේ නායකත්වයන්ට ප්‍රතිවිරුද්ධ නායකත්වයක් යන්න කවරයේ කතාවෙන් මතු කරන්නටය.

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා


**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 500.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය සය මසකට - රු. 250.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com

**BHAKTHI PRABODHANAYA**

Local Subscription Rate.

Rs. 500.00 per year (Including Postage)
Rs. 250.00 per six months
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com

# "පොරොන්දු විජිතයේ හිමිකම් ලද්දෙමු"

හෙළිදරව්ව

පොරොන්දු යනු යමක් ලබාගන්නට සහ ලබා දෙන්නට දෙපාර්ශ්වයක් අතර ඇති වන ගිවිසුමකි. රජ කෙනකු යටතේ මෙහෙයවන භූමි ප්‍රමාණය, රාජ්‍යයක් හෙවත් විජිතයක් ලෙස හඳුනා ගත හැකිය. හිමිකම් නම් තමන්ට අයිති දෑ ගැනීමට සුදුසුකමකි. වචන අර්ථයෙන් ඉහත ආකාරයට විග්‍රහ කළත් මීට වඩා ගැඹුරු දේව ධාර්මික අනාවරණයක් අපගේ තේමාව තුළ ගැබ්වී ඇති බව විද්‍යමාන වේ.

පාරාවෝ රජවරුන්ගේ වහල්කමට යටවී කල්ගත කළ ජුදෙව් ජනතාව ලක්ෂ ගණනක් ඉතිහාසයේ එක් අවධියක පොරොන්දු දේශයට ගමන් ආරම්භ කළ ආකාරය ශු. බයිබලය අපට පවසයි (නික්ම. 12:37). කුසගින්න, පිපාසය, අධික රස්නය සහ සීතල දැනෙන විට පාළුකරයේ කර්කශභාවය දෙගුණ තෙගුණ විය. එනිසා ජනතාව මැසිවිලි නැගුවෝය. චෝදනා කළෝය. මිසරයේ වහල්කම පොරොන්දු දේශයට යන ගමනට වඩා හිතකර යයි මේ ජනතාව විටක සිතූහ. එහෙත් ගැඹුරු නිහඬතාවකින් අනූන වූ පාළුකරය දෙවිඳුන්ගේ විමුක්ති ගමනට ආලෝකවත් දිශාවක්ම විය. දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම සහ ඊට සාක්ෂි දැරීම ඇරඹිය යුත්තේ කාන්තාරයක් බඳු වූ අත්දැකීමක් ඔස්සේ යැයි මින් ඉස්මතු නොවන්නේද?

ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය පූර්ණ වශයෙන්ම මානව සංහතිය ගලවා ගැනීමට පූජා වූ ජීවිතයකි. ක්‍රිස්තු විමුක්තිය යනු පාපයෙන් පමණක් නොව ලෙඩදුකින්, තෘෂ්ණාවෙන්, අන්ධ ඇදහීමෙන්, මායාවෙන්, ව්‍යාජ භීතියෙන්, ඇබ්බැහිවීමෙන්, කලකිරීමෙන්, සැකයෙන්, අධිතක්සේරුවෙන් හා අවතක්සේරුවෙන් ජීවිතය විනාශ කර ගන්නට පෙළඹෙන්නන් ඒවායින් මුදවාලන මහා බලයකි. ක්‍රිස්තුස් වහන්සේ අප හැම පොරොන්දු විජිතයක හිමිකම් ලබන්නට කැඳවා ඇත. එය ස්වර්ගයයි. නව ජෙරුසලමයි. දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුවන දෙව් රජයයි. ක්‍රිස්තු ආකල්ප, වටිනාකම්, ප්‍රතිපත්ති සහ දහම් මග පිළිගෙන ගැලවීම ලබා ගැනීම ඉතාමත් පහසු නොවුණත් ඉතාමත් අපහසුද නොවේ.

වර්තමානයේ ඔබත් මමත් එදා ඊශ්‍රායෙල් ජනතාව මෙන් වහල්කමේ අධිපතිකම් රජයන ලොව නැමැති රතු මුහුද, කාන්තාරය මැදින් ගමන් කරන ජනතාවකි. එදා පාරාවෝගේ හමුදා ජනතාව පසු පස හඹා ආවා සේ මුදල, බලය, තනතුරු, කීර්තිනාමය, අහංකාරකම, කුහකකම අප හඹා එයි. විවිධ දෙවිවරුන් හදාගෙන වැඳුම් පිදුම් කරමින්, පුදුම ලකුණු සොයමින්, පීඩිතයන් තව තවත් පීඩනයන් කරා තල්ලු කරන ක්‍රමවේදවලට ඉනිමං තබමින්, අතෘප්තිකර ආශා උපරිම තෘප්තිමත් කර ගන්නට දරන කෑදරකමින්, දහම් වටිනාකම් උඩුයටිකුරු කරන බලවතුන්ට ප්‍රශස්ති ගායනා කරමින්, මාංසය, ලෝකයා හමුවේ නිවට වී ඒ තුළම ඇලී, ගැලී, වෙළී සිටින්නට දක්වන වුවමනාව නූතන වහල් ස්වභාවය ලෙස හඳුනා ගත හැකිය. මේ වහල් ස්වභාවවලට යටවෙමින් සමාජය තුළ හුදු ජනප්‍රියත්වයක් ලබා ගැනීමට දරන වෑයම, අපගේ ක්‍රියාකාරී විය යුතු ඇදහිල්ල, මළ ඇදහිල්ලක් බවට පත් නොවේද? (ජාකොබ් 5:17). පාළුකරය පාදක කරගෙන පෙන්වන බලාපොරොත්තුවේ විමුක්ති විජිතය මායාවක් යයි ප්‍රකාශ කරන්න හදන විවිධ මත, පුද්ගලයන්, භෞතික දෑවලට යටවෙමින් තම වාසිය, ලාභය, සුවපහසුව වෙනුවෙන්ම ජීවත්වීම පොරොන්දු විජිතය නම් වූ ස්වර්ගයට හිමිකම් නැතිකර ගැනීමට මගක් විය නොහැකිද?

එබැවින්, අපගේ අත්දැකීම අනුව නම් කිතුනු කැඳවීම අරගලයකි. හද පණ ගැහෙනා තුරු යා යුතු නිම නොවන ගමනකි. ගල් පර්වත, රතු මුහුද, කාන්තාර පසුකරමින්, නපුරු සතුරාට නොබියව මුහුණ දෙමින්, ක්‍රිස්තු අනුගාමිකයන් ගමන් කළ යුතු අතර, ඔවුන් ක්‍රිස්තු දැක්මෙන් පෝෂණය වන, දෙවිඳු ප්‍රේමයෙන් දිනපතා පිරෙන, සහෝදර ජනතාව පවා නිවැරදි දිශාවට යොමු කරන්නට හැකි, සොබාදහමට ආදරය කරන පරාර්ථකාමී ප්‍රේමයේ හෙවත් "අගපෙ" "Agape"ජීවිතයේ කැඩපතකි.

සත්‍යය වෙනුවෙන් හඬ නැගීම පමණක්ම, ප්‍රමාණවත් නොවේ. තමන් කථා කරන සත්‍යතාවට අගයක් එකතු වනුයේ සාධාරණ ජීවිත රටාවකට

තම ක්‍රියාද එකතු වූවොත් පමණකි. එසේ නොවන කල එය ප්‍රෝඩාවකි. දෙබිඩි පිළිවෙතකි. වර්තමාන සමාජයේ තිබෙන බොහෝ ගැටලු, අර්බුද, වඩා සංකීර්ණ වී අවුල් වන්නේ බොහෝ අයගේ ක්‍රියාපරිපාටියේ තිබෙන මෙම දෙබිඩි, කුහක පිළිවෙත නිසාය. එදා ක්‍රිස්තුස් වහන්සේට එරෙහි වූ ක්‍රිස්තු විරෝධී බලකේන්ද්‍ර උන්වහන්සේව ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධාන හේතුවක් වනුයේ ඒ කුහකකම ක්‍රිස්තුන් වහන්සේ ප්‍රසිද්ධියේ මතුකරමින් ඔවුන්ගේ දෙබිඩි පිළිවෙත විවේචනය කිරීමය (ලූක් 12:1). ඔවුන්ගේ අන්ධ ඇදහීම නිසා තමන්ගේ ගැලවීම අහිමිකරගන්නවා යන්නද ජේසුස් වහන්සේ අවධාරණය කළහ.

අප අපේම වහල්කම් හඳුනාගෙන ඒවායින් නික්මයන අතරතුර අප සහෝදර ජනතාවද මේ නික්මයාමේ සටනට පෙළ ගස්වමු. මේ අරගලය දිනීමට අප සමිඳාණන් සමග කොන්දේසි විරහිත ප්‍රේමයේ ජීවිත ගමනක් යා යුතුව ඇත. එවන් නිදහස් නිවහල් ගමනක අවසානයේ පොරොන්දු විජිතය ක්‍රිස්තු සමිඳාණන් තුළ ලැබීමට දිනක අපි භාග්‍යවන්තයෝ වෙමෝවායි ප්‍රාර්ථනා කරමු.



## පාඨක ඔබ වෙත කාරුණිකව දැනුම් දෙමු.

නොසිතූ මොහොතක ඇතිවූ කොරෝනා වයිරස් දෙවන රැල්ල නිසා භක්ති ප්‍රබෝධනය නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි සහ පෙබරවාරි කලාප ඔබ අතට පත් කිරීමට නොහැකිවීම ගැන කණගාටු වෙමු. එමෙන්ම අප කලින් සැලසුම් කර තිබූ සියලු තේමාවලින් බැහැරව මේ කාලයට ගැලපෙන තේමාවකින් භක්ති ප්‍රබෝධනය යළිත් ඔබ අතට පත්වී ඇත. කෙසේ වෙතත් ඔබ අප වෙත එවන ලද ලිපි අවස්ථාවන්ට අනුකූලව ඉදිරි භක්ති ප්‍රබෝධන කලාපවල ඉඩකඩ තිබෙන ආකාරයට තෝරාගත් ලිපි පළ කරන්නට අපේක්ෂා කරමු.

විශේෂයෙන් දායක මුදල් දී ඇති පාඨකයන්ට ඔබ දුන් මුදල් ආවරණය වනතෙක් ඔබට ඉදිරියේදී භක්ති ප්‍රබෝධන කලාප ලැබෙන බව මතක් කරමු. ඔබගේ පිටපත නොලැබී ඇතිනම් කරුණාකර පහත අංකයන්ට දුරකථන ඇමතුමක් දී හෝ ලිපියකින් දැනුම් දෙන්න. (011 269 817 7 / 071 841 554 9)

සඟරාව සම්බන්ධයෙන් ඔබගේ අදහස් සහ එහි අභිවෘද්ධිය සඳහා කිසියම් විවේචනයක් කළ යුතුනම් එය ඉතා සැකෙවින් අප වෙත ලියා එවන්න. ඔබ එවන ලිපි යතුරුලියනය කර (ටයිප් කර) අපගේ විද්‍යුත් තැපැලට එවීම අපගේ කටයුතු වඩා පහසු කරයි.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමාවන්

**2021 මැයි මාසය - "වාක් ප්‍රසාද ගැබයෙනි"**
මැයි කලාපය සඳහා ඔබ එවන ලිපි මාර්තු 31 ට පෙර අප වෙත එවන්න.)

**2021 ජූනි මාසය - "මිහිතලයට පිහිතලය නොතබන්න"**
ජූනි කලාපය සඳහා ඔබ එවන ලිපි අප්‍රේල් 30 ට පෙර අප වෙත එවන්න.)

# නික්මයාමේ අධ්‍යාත්මය

ශුද්ධවූ බයිබලයේ පුරාණ ගිවිසුමේ කේන්ද්‍රීය සිදුවීම ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් නිදහස් වීමයි. ඉශ්‍රායෙල් ජනතාව වහලුන් බවට පත්වූයේ කෙසේද? ජෝසප් මිසරයේ දේශාධිපති ධූරයට පාරාවෝ පත්කළ පසු ජෝසප්ගේ පියා වන ජාකොබ් ඇතුළු සහෝදර කැළ සාගතය හේතුවෙන් මිසරයට පැමිණි පසු ජෝසප් සමග මිසරයේ පදිංචි වූහ. එම ජෝසප්ගේ පරම්පරාව මිසරයේ පදිංචි වීම සරණාගත අත්දැකීමක් හෝ ආක්‍රමණකාරී ක්‍රියාවක් නොව ජෝසප්ගේ කාලයේ සිටි පාරාවෝ රජුගේ පූර්ණ අනුදැනුම සහ වරප්‍රසාදයෙන් සිදුවූ ක්‍රියාවකි. එබැවින් ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ ජීවත්වීම ගෞරව තත්ත්වයකි. දේව තිළිණයකි (නික්මයාම 11-7).

පසුකාලීනව ජෝසප්ගේ පරම්පරාව නොහඳුනන අලුත් රජකුගේ සිංහාසනාරූඪ වීම සමඟ ඉශ්‍රායෙල් ජනතාව මිසර වැසියන්ට තර්ජනයක් සේ සලකන්නට වූයේ ඒ රජුගේ බලලෝභී ජාතිවාදී ආකල්ප නිසාය. "එකල ජෝසප් ගැන කිසිවක් නොදත් අලුත් රජෙක් සිංහාසනාරූඪ විය. ඔහු තම සෙනගට කතා කොට බලන්න, ඉශ්‍රායෙල් ජනතාවගේ සෙනග අපට වඩා ගණනින් වැඩි වී බලවත්ව අපට තර්ජනයක් වී ඇත. දැන් ඉතින් කන්දෙන්න, ඔවුන්ගේ සංඛ්‍යාව වළකනු පිණිස අපි ඔවුන් සම්බන්ධයෙන් සිහිනුවණින් ක්‍රියා කරමු. යම් හෙයකින් යුද්ධයක් ඇති වුවහොත් ඔවුන්ද අපේ සතුරන් සමග පෙරමුණු බැඳගෙන, අපට විරුද්ධව සටන්කොට රට පාලනය කරන්න පුළුවනැයි කීය" (නික්මයාම 1:8-10).

අලුත් රජවූ මිසරයේ පාරාවෝ ධාර්මික පාලනයක් කළේ නම් මිසර වැසියන් සමග ඉශ්‍රායෙල් ජනතාව විවිධ ජාතීන් ලෙස රටේ අභිවෘද්ධිය පිණිස නිවැරදිව මෙහෙය වන්නට තිබුණි. එනමුත් මිසර පාලකයා බලලෝභී වූ කළ යුද්ධයක බිය නිර්මාණය කරමින් මිසරයේ ඉශ්‍රායෙල් ජනතාව අරඹයා පිළිකුලක් සහ භීතියක් නිර්මාණය කරමින් ඔවුන් වහල් තත්ත්වයට ඇද දැමුවේය.

අද අප දේශයේ ද සිදුවන්නේ මෙවැනි පාලන තන්ත්‍රයකි. මුස්ලිම් ආක්‍රමණ බිය වරකත්, දෙමළ ජනතා නැගිටීම වරකත්, මවා පාමින් සිංහල බහුතර ජනතාව රවටමින් බල ලෝභීව අප දේශයේ ස්වාභාවික සම්පත් විනාශ කිරීමය. මේ දේව පාලන ක්‍රමයට විරුද්ධ පාලන තන්ත්‍රය, නික්මයාමේ දෙවියන් වහන්සේ, අනුමත නොකරන සේක.

අවුරුදු 400 පමණ ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ පාරාවෝ රජු යටතේ වහල්කමින් පීඩා වින්දහ. "එබැවින් ඔවුන්ගෙන් බර වැඩ ගෙන ඔවුන්ට පීඩා කරන පිණිස ඔවුහු ඔවුන් කෙරෙහි විධායකයන් පත්කළහ.

මෙලෙස ඉශ්‍රායෙල් ජනයා පාරාවෝ සඳහා පීතොම් සහ රාමෙසෙස් යන ගබඩා නගර ගොඩනැගූහ. එහෙත් පීඩා විඳින්න විඳින්න ඔවුහු වඩ වඩා වැඩිවී වර්ධනය වූහ. මිසර දේශ වාසීහුද ඉශ්‍රායෙල් සෙනඟට බිය වී ඔවුන්ගෙන් බලහත්කාරයෙන් වැඩ ගත්හ..." (නික්මයාම 1:11-13).


ජනතාවගේ දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවට උරුම කර දුන් වරප්‍රසාදීය ජීවිත ක්‍රමය මිසරයේ පාරාවෝ රජුගේ බල කාමය නමැති පෞද්ගලික පාපය නිසා වහල්කම නමැති දුඃඛිත තත්ත්වයකට පත්විය. එම පෞද්ගලික පාපය දේව ගරුබිය නොමැතිකම තුළ ව්‍යුහාත්මක පාපය ලෙස පීඩක ක්‍රමයක් දක්වා සමාජ පාපිෂ්ඨ ක්‍රමයක් නිර්මාණය කළේය. බලන්න, පළමුව බලලෝභීව ජාතිවාදී වූයේ පාරාවෝ නමැති එක පාලකයෙකි. එහෙත් පසුව මුළු මිසර වැසියන්ම ඉශ්‍රායෙල් ජනතාවගෙන් බර වැඩ ගන්නා තරමට ජාතිවාදී අසාධාරණ ජන කොටසක් බවට පත් වුණේය.

අප පවුලේ හෝ මීසමේ හෝ සංඝයේ හෝ ගමේ හෝ අප දේශයේ හෝ ලෝකයේ හෝ එක්කෙනකු තෘෂ්ණාව නිසා පෞද්ගලිකව පාපය කිරීමේදී ක්‍රමක්‍රමයෙන් දේව භය සහ දෙවියන් වහන්සේ කෙරෙහි නිවැරදි ස්ථිර විශ්වාසය නොමැතිකම තුළ සමාජ පාපයක් දක්වා පාපය බිහිසුණු ලෙස වර්ධනය වේ. (Personal sin, Structural sin, Social sin)

"මිසර දේශයේ රජතුමා හෙබ්‍රෙව් වින්නඹුවන් වන ෂිප්රා සහ පුවාට කතා කොට, 'නුඹලා හෙබ්‍රෙව් ස්ත්‍රීන්ට වින්නඹුකම් කරන විට බිහිවන්නට යන්නේ දුවක්ද පුතෙක්ද කියා හොඳින් බලන්න. පුතෙක් නම් මරන්න. දුවක් නම් ඈ ජීවත් වුණාවේ කියා පැවසීය. එහෙත් වින්නඹුවෝ දේව භය ඇති අය නිසා මිසරයේ රජතුමා අණ කළ පරිදි ඉටු නොකොට

පිරිමි දරුවන්ට ජීවත්වන්නට ඉඩ හැරියාහ. දෙවියන් වහන්සේ වින්නඹුවන්ට මහා කරුණාව පෑ සේක. සෙනග ද සංඛ්‍යාව වැඩිවී ඉතා බලසම්පන්න වූහ" (නික්මයාම 1:15-20).

මිසර රජුගේ බල තණ්හාව නැමති පෞද්ගලික පාපය මිසර වැසියන්ගේම සමාජ පාපය බවට පත්වී අති ම්ලේච්ඡ ලෙස හෙබ්‍රෙව් (ඉශ්‍රායෙල්) ජනතාව ව්‍යුහාත්මක ජන සංහාරය කිරීම දක්වා දරුණු විය. එනමුත් ඉශ්‍රායෙල් ජනතාවගේ පෞද්ගලික දේව ඇදහිල්ල සමස්ත ඉශ්‍රායෙල් ජනතාවගේම පොදු ඇදහිල්ල ලෙස බලසම්පන්න වූයෙන් දෙවියන් වහන්සේ දුක් විඳින ඉශ්‍රායෙල් ජනතාව වෙනුවෙන් සටන් කරන්නට ආරම්භ කළසේක.



අප ශ්‍රී ලංකාවේ මීට අවුරුදු 200 කට පමණ පෙර ඉංග්‍රීසි යටත් විජිත පාලන කාලයේ ගෙන්වා ගත් කඳුරට දමිළ ජනතාවද ඉශ්‍රායෙල් ජනතාව සේම අධික ලෙස පීඩා විඳිමින් අදත් ලයිම් කාමරවල දුක් විඳින්නේ නිශ්චිත නිවාස අයිතියක් නොමැතිව වහල් කම්කරුවන් සේය. ලාංකික පුරවැසියන්ට උරුම නිදහස් අධ්‍යාපනයේ වරප්‍රසාද සහ රාජ්‍ය සෞඛ්‍ය සේවා හරියාකාරව ඔවුන්ට නොලැබී තේ සහ රබර් වතුවලට පමණක් කොටුවූ වහල් ජීවිත ක්‍රමයක් වින්දත් ඉශ්‍රායෙල් ජනතාව සේ ඔවුන්ද ප්‍රබල දේව ඇදහිල්ල තුළ සහ දේව ගරුබිය තුළ බලසම්පන්න වන්නේය. මේ සමාජීය, දේශපාලනික, ආර්ථික සහ ආගමික පසුබිම තුළ නික්මයාමේ අධ්‍යාත්මය ක්‍රමයෙන් ගොඩනැගෙයි. නික්මයාමේ අධ්‍යාත්මය යනු කුමක්ද?

"බොහෝ කාලෙකට පසු මිසරයේ රජතුමා මිය ගියේය. ඉශ්‍රායෙල් ජනයා වහල් සේවය නිසා සුසුම්ලමින් මොරගැසූහ. ඔවුන්ගේ වහල් සේවය නිසා ම ඔවුන්ගේ කන්නලව්ව දෙවියන් වහන්සේ වෙත පැමිණියේය. දෙවියන් වහන්සේ ඔවුන්ගේ කන්නලව්වට සවන් දී තමන් වහන්සේ ආබ්‍රහම්, ඊසාක් සහ ජාකොබ් සමග කළ ගිවිසුම සිහිපත් කළ සේක. උන්වහන්සේ ඉශ්‍රායෙල් ජනයාගේ දුක බලා ඔවුන්ට කරුණාව පෙන්වූ සේක" (නික්මයාම 2:23-25).

ප්‍රේමයේ ගිවිසුම උදෙසා දෙවියන් වහන්සේ කරන හඬ ගැසීමට මිනිසා නිදහස් කැමැත්තෙන් දෙන අභ්‍යන්තර ප්‍රතිචාරය අධ්‍යාත්මිකත්වයයි. නික්මයාමේ අධ්‍යාත්මය වන්නේ ඉශ්‍රායෙල් ජනතාවගේ කිසිඳු යහපත් ක්‍රියාවක් නිසා නොව ඔවුන්ගේ වහල් සේවයේ දුඃඛිතකම පමණක් නිසාම දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවගේ මොරගැසීමට සවන්දී, සංවේදී වී ක්‍රියාකාරී ලෙස වහල්කමින් එතෙර කිරීමයි.

මේ නික්මයාමේ අධ්‍යාත්මය තුළින් දෙවියන් වහන්සේ අද අපට කියා දෙනසේක් ඕනෑම විමුක්ති ගතිකයක් තුළ තියෙන ද්විත්ව ක්‍රියාකාරීත්වයි. එනම් පළමුව දෙවියන් වහන්සේ නොනිදා සිට ප්‍රාරම්භක පියවර ගෙන ප්‍රේමයේ ගිවිසුම පිණිස නිදහස් කැමැත්තෙන් දෙවිඳුන් සොයන මිනිසා වෙත පැමිණීමයි. දෙවනුව මිනිසාගේ ස්ව කැමැත්තෙන් තමන් වහල් කරන පුද්ගලයා හෝ දෙයක් හෝ ක්‍රම වේදය (System) හෝ අත්හැර ප්‍රේමයේ සාමූහික ගිවිසුම වෙතට ගමන් කිරීමයි. එබැවින් නික්මයාමේ අධ්‍යාත්මය එක සිදුවීමක් පමණක් නොව ක්‍රමයෙන් විකාශනය වන ජීවිත ගමනකි. එක දවසින් අප කිසිවකු නිදහස් වන්නේ නැත. ක්‍රමක්‍රමයෙන් දේව පොරොන්දුව ඇදහිල්ලෙන් අයිතිකරගෙන ප්‍රේම ගිවිසුමට දෙන අභ්‍යන්තර ප්‍රතිචාර මාලාවකින් ආකල්ප සහ බාහිර ක්‍රියාකාරීත්වයකින් නික්මයාමේ අධ්‍යාත්මය වර්ධනය වේ.

"එදින රාත්‍රියේ මම මිසර දේශය මැදින් ගොස් එහි මිනිසුන්ගේ හා මෘගයන්ගේ කුළුඳුලන්ට පහර දෙමි. තවද මිසරයේ දෙවි දේවතාවුන් සියල්ලන්ට දඬුවම් පමුණුවමි. මම සමිඳාණන් වහන්සේය. මම ලේ දකින විට නුඹලා පසුකර යන්නෙමි." (නික්මයාම 12:12-13).

නික්මයාමේ සිදුවීම බයිබලීය කතුවරයා රචනා කරන විට යොදා ගන්නා හෙබ්‍රෙව් වචනය " ආබාද්" ය. හෙබ්‍රෙව් භාෂාවේ "ආබාද්" යනු සේවයයි. (Voluntary Service) මෙම ආබාද් (සේවය) කොටස් දෙකක් ලෙස නික්මයාමේ සිදුවීමේ ලියවෙයි. එකක් වහල් සේවය (Slavery) දෙවැන්න දේව සේවයයි. (Worship) ප්‍රේමය නැති සේවය වහල්කමයි. ප්‍රේමය

ඇති සේවය නමස්කාරයයි. එනම් දේව සේවයයි. වහල්කම ඇති තැන දේව සේවය නැත. දේව සේවය ඇති තැන වහල්කම නැත.

ඉශ්‍රායෙල් ජනතාව කළ වහල්කම තුළ දෙවියන් වහන්සේට නිදහසින් නමස්කාර කළ නොහැකිය. දෙවියන්ට නමස්කාර කිරීමට නිදහස අත්‍යවශ්‍යය. අභ්‍යන්තර හේතුවක් නිසා හෝ බාහිර සාධකයක් නිසා හෝ තමන් හෝ ජනතාව නිදහස් නොමැති තැන දෙවියන්ට සේවය කළ නොහැකිය.

ඒ නිසාම දෙවියන්ගේ නියෝගය වූයේ ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් නිදහස්වී සීනයි කඳු පාමුල සැබෑ වූ විමුක්තිදායක දෙවියන් වහන්සේට දේව සේවය හෙවත් නමස්කාර කිරීමට ඒකරාශී වීමයි. සැබෑ දේව නමස්කාරයේ ප්‍රතිඵලය සාංඝික ජීවිතයයි. සාමූහිකත්වය උදෙසා සේවයට කැප වීමයි. පාස්කුව හෙවත් එතෙරවීම හෙවත් නික්මයාම තුළ දෙවියන් වහන්සේ අයුක්ති සහගත පීඩකයාට පහරදෙන සේක. වහල් ක්‍රමය ප්‍රවර්ධනය කරන වස්තුව නමැති (බාල්) දෙවියන්ට දඬුවම් කරන සේක. ඉශ්‍රායෙල් ජනතාව පවුල් ලෙස වහල්කමින් නිදහස්වීමේ පාඵකර ගමන ඇරඹීම උදෙසා කළ පූජා නිවස දෙවියන් වහන්සේ පසුකරගෙන යන සේක. එනමුත් ධනපති ක්‍රමය නමැති පීඩක ක්‍රමය හෙවත් වස්තුවට නමස්කාර කරන පාරාවෝගේ සිට සියලු දෙනාගේ පවුල්වලට දෙවියන් වහන්සේ පමුණුවන මරණ දූතයා පහර දෙන්නේය. නික්මයාමේ දෙවියන් වහන්සේ පීඩිතයාගේ විමුක්තිය උදෙසා පීඩකයා, ඒකාධිපතියා, අධිරාජ්‍යයා සහ වහල් කරන්නාට එරෙහිව සටන් කරමින් පාඵකරය නමැති අතහැරීමේ දුෂ්කර ජීවිත ක්‍රමය තුළින් ප්‍රීතියේ විමුක්තිය අපට උරුමකර දෙන සේක.

නික්මයාමේ අධ්‍යාත්මයේ පරමාදර්ශය කුරුසිය ජයගත් ක්‍රිස්තුන් වහන්සේය. කුරුසියේදී බැලූ බැල්මට පාපයේ, අයුක්තියේ බලය ජයග්‍රහණය කරන කල එම බලය පරාජිත වන්නේ උත්ථානය තුළය. එසේම ප්‍රේමය බැලූ බැල්මට කුරුසිය මත මරණයට පත්වී පරාජිත වන මොහොතේ ප්‍රේමය ජයග්‍රහණය කරමින් පාපයේ, වහල්කමේ, අයුක්තියේ, ජාතිවාදයේ, වසංගතයේ බලය බින්දේය. ක්‍රිස්තුන් වහන්සේ අද අප අතර බලවත්ව ජීවමානය. පීඩිතයාගේ සටන ජයග්‍රාහී කරන සේක.

**ගරු ජීවන්ත පීරිස් පියතුමා**

උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේගේ දෙව්මැදුර,
දොලොස්වල.

# දෙවියන් සහ සාතන්

පිහිය වනාහි
කුස්සියට අත්‍යවශ්‍ය මෙවලමකි.
මෙය නැතිව, ඉවුම් පිහුම් අපහසුය.
පිහියෙන් අත පය කැපෙන්න ද හැකිය.
සංකල්ප, විශ්වාස, මතවාද සහ
ක්‍රමවේද ද එසේය.

යහපත සඳහා මෙන්ම
අයහපත පිණිස ද
ඕනෑම දෙයක් උපයෝගී කර ගත හැකි ය.
නෛසර්ගිකව
කිසිවක් හොඳ හෝ නරක හෝ නැත.
හොඳ සහ නරක යන දෙකම
හැම ක්‍රමවේදයකම ඇත.
පවතින යථාර්ථයේ යහපත උලුප්පා පෙන්වා
එහි අමනුෂ්‍යත්වය හා නොපිළිවෙළ සැඟැවීමට
බලධාරීන්ට හැකි වනුයේ
බහු ජන චින්තනය පටු වූ විට ය.

සමස්තයට සිදු විය හැකි විපත්තිය නොතකා
තමන්ගේ පටු වාසිය තකා
ඕනෑම ක්‍රමවේදයක්, මතවාදයක් හෝ සම්පතක්
උපයෝගී වන්නට හැකිය.
නූතන තාක්ෂණය, සාම්ප්‍රදායික ඇනුම
ස්වරාජ්‍යවාදය, අධිරාජ්‍යවාදය
දේව සංකල්පය, අදේවවාදය
ආධ්‍යාත්මිකවාදය, භෞතිකවාදය
ආගම, නිරාගම
කොමියුනිස්ට්වාදය, ධනවාදය
ජාතිකවාදය, ගෝලීයවාදය ආදි හැමදෙයක් ම
විමුක්තිය හෝ විපත්තිය පිණිස
උපයෝගී විය හැකි ය.

උපයෝගී වීම තීන්දු වනුයේ
සම්පත්ලාභීන්ව, බලධාරීන්ව හෝ ධනවාදීන්ව
මෙහෙයවනු ලබන්නේ කෙලෙස් විසින් ද
නැත්නම් ආදරය විසින් ද යන කාරණය මතය.
සාතන් යනු කෙලෙස් ය.
නොහොත්, අනර්ථකාරී මනුෂ්‍ය ස්වභාවයි.
අනිසි ලෙස අපව මෙහෙයවන මායාව එය වේ.
ශුද්ධාත්මයාණන් යනු සැබෑ ආදරය වේ.
නොහොත්
උත්තරීතර මනුස්සකම වේ.
අනිසි ලෙස අපව මෙහෙයවන මායාව
අප තුළ දුබල කර
නිසි ලෙස අපව මෙහෙයවන
ජීවනය ශුද්ධ ආත්මයාණෝය.

**සපුගස්කන්දේ රංජිත්**

# කුරුසියෙන් තොර උත්ථානයක් නොමැත .....

Euthanasia (කරුණාවන්ත මරණය), මෙය ලොව බොහෝ රටවල විවිධ නීති ප්‍රකාර දැනටත් වන නීතිගත මරණ ක්‍රියාවකි. තවම ශ්‍රී ලංකාව තුළ එය එසේ නූනත්, එය එසේ නොවෙනවායැයි කීමට නොහැකිය. කොරෝනා සමයේ කතාකළ ICU ඇඳන් තවම ඒ ගණනම වෙන අතර, ICU (තීව්‍ර ප්‍රතිකාර ඒකක) ඇඳන් තවමත් 1000කට අඩුය. මිලියන 22 ඉන්නා රටක මේ ICU ඇඳන් බොහෝ විට 90%කට වඩා පිරී ඇති අතර හදිසි ලෙඩෙකුට දීමට ඇඳන් තිබේද? උක්ත කාරණය මෙහිදී සලකා බැලේද?. එසේ කරයිද? එනිසා මෑත අනාගතයේදී උක්ත කාරණ නීතිගත කිරීමට ඉඩ ඇත. සම්පත් සීමිත රටක එය එසේ නොවුණායැයි කීම අරුමයක් වනු ඇත.

තවද ඕනෑම රෝගියකු අවුරුදු 80න් එහා පැත්තේ මැරුණ විට අප හුදී ජනයා, එයාට ඉතින් වයසයිනේ? යයි ඔබ මට ඇසී ඇත. ඔවුන් රෝගී වූ විට පවා මා මිතුරන් එසේ කියනු මට ඇසී ඇත. මාගේ මිත්තණිය වයස 92දී පපුවෙ අමාරුව හැදී මා විසින්ම රෝහල් ගත කළ අතර මේ කතාව මට හැමදාම අසන්නට ලැබුනේ ඈ මළාට සමාජයට කමක් නැති නිසාද?.

ඇය දැන් 99කි. තවම උපැස් යුවල, නැතුව කියවයි. පසුගිය වසරේ දෙසැම්බර් මාසයේ මාගේ මානසික ව්‍යාධි ඇති මාමා මියයන තුරු ඇය ඔහුව බලාගත්තාය. තවම දෙවිඳුන් දුන් අවුරුදුවලට ස්තෝත්‍ර කරයි. එපමණක් නොව උයා පිහා ගනී. මෙසේ ඉතාමත් වයස ඇතැයි සම්මුති හා ගබ්සා ගැන අප සමාජයේ ආකල්ප ඉතාමත් ක්‍රෑර යයි මට සිතේ.

(Resurrection through cross)/ කුරුසියෙන් තොර උත්ථානයක් සිතීම අප විශ්වාසයට පටහැනි යයි මට සිතේ. පුරාණයේ ශුද්ධවන්තයන් සේම 1993 උපත ලැබූ ලූයුකේමියා රෝගයෙන් මියගිය අවුරුදු 14ක් ගියත් අදටත් නොදිරූ සිරුර අසීසිය, ඉතාලියේ අපට පෙන්වන යථාර්ථය වන්නේ ජේසුස් වහන්සේගේ නොදිරන වචන වේ. (අහසත් පොළවත් පහව යන්නේය, මාගේ වචනය පහව නොයන්නේය).

එනිසා එදත් අදත් උන්වහන්සේ කියුදේ සත්‍ය අතර ගබ්සා හා Euthanasia (කාරුණික මරණ) යුරෝපයේ හා අනිකුත් රටවල නීතිගත කිරීම සොදොම් හා ගොමෝරාවක ආරම්භයකැයි මට හැඟේ.

එනිසා ඉපදීම, ලෙඩවීම, හා මරණය අතර අප ගෙවන විඳවීම්ද ඒවා පහසුකරන හා අවශ්‍ය වූ විට අප ජීවිතත්, නොදරුවන්ගේ ජීවිතත් විනාශ කිරීමට අපට ඇති අයිතිය කුමක් ද?

කෙතරම් අප විද්‍යාත්මකව දියුණු වූවත්, සමහර රෝගවලට ප්‍රතිකාර සොයා ගත්තත්, ඉතාම සරල අධික රුධිර පීඩනය, දියවැඩියාව, අධික කොලෙස්ටරෝල් මට්ටම්වලට නිත්‍ය, නිට්ටාවටම සුව වන බෙහෙතක් නොමැති වන අතර, ජීවිත කාලයටම බෙහෙත් ගිලීමට වුවමනාය. **ජීවිතයක් ඇති කරන්න බලය නැති කිසිකෙනකුට එය නැති කිරීමට කිසිදු අයිතියක් නැත.**

අප නැවත සිතා බැලිය යුත්තේ කුරුසය දරාගෙන යාමත්, අන් අයගෙ කුරුසයට සීමොන් කෙනකු වීමත් නොවේද?

ක්‍රිස්තුධර වචන පිළිපැදීමට උත්සාහ කරන අප, අනාගාමික (Secular) වීමට වෙරදරන උද්ධච්ච මිනිසුන් ඇති කර ගත් සමහර රටවල, වූ නීති දෙසට යනවාද, යන්න නැවත සිතා බැලිය යුතුවේ.

**උඩගුව පාපයකි. එනිසා බටහිර හුරුවෙන් අපට ගතයුතුදේ බොහෝ වෙතත්, වේදනා රහිත මරණ හා ගබ්සා ගැන කථා කිරීමේදී ජීවිතයේ අමිල ස්වභාවය සහ පරිත්‍යාගී කැපකිරීමක් තුළ මෙය වඩා පුළුල්ව සාකච්ඡා කිරීම වටී. ඒ අතරතුර උඩගුව හා බලාපොරොත්තු ඉහළ තබාගෙන ඒවා ඉෂ්ට නොවීම තුළ ඉච්ඡාභංගත්වය නිසා විෂාදය (Depression) වන්නා වූ සියදිවි හානි කිරීමත් ඉතාමත් බරපතළ වූ පාප බව අප සිහි තබා ගත යුතුවේ.**

මාපියන් ලෙස දරුවන් හෝ, දරුවන් ලෙස තම මව්පියන් හෝ අපට අයිති නැති

අතර අප ඇතුළු සියලු මනුෂ්‍යයන් දෙවිපියාණන් වහන්සේට අයිති ජීවිත බව අපගේ විශ්වාසය වේ. උගත් යැයි සම්මත වෛද්‍යවරුන්වත්, පවුලට අවශ්‍ය නොවූ දරුවන් (unwanted pregnancy) යැයි පවසන "පවුල් සැලසුම් ව්‍යාපාරයට" අනුව, පවුල සම්පූර්ණ කිරීමෙන් පසු ලැබෙන දරුවන් නැති කිරීම හෙවත් ඝාතනය කිරීම මනුෂ්‍ය අපට කිසිසේත්ම අයිති ක්‍රියාවක් නොවේ.

සුදු ගවුම ඇඳගෙන පාසල් යායුතු හැම දිනකම උදෑසනින් පාසල් ගිය දහවන ශ්‍රේණියේ බාලිකාවකට ගබ්සාවක් කිරීමට සිදුවුණත් එය පන්තිබාර ගුරුතුමිය හෝ වෙනත් ගුරුවරියක් හෝ විදුහල්පති පැවිදි සොයුරිය හෝ අවම වශයෙන් තම දයාබර මෑණියන්වත් නොදැන ගබ්සාව සිදුවීමට තරම් ඛේදනීය තත්ත්වයකට අප සමාජය තල්ලු වුණේ කෙසේද?

අපේ රටේ අගතියට පත් දුගී කාන්තාවන් රටේ වූ අනවසර ගබ්සාගාරවලට යන අතර, ඉතාමත් අනතුරුදායක ලෙස ගබ්සා කරගෙන ජීවිතයෙන් පවා සමුගන්නා අවස්ථා ඇත. මෙය එසේ වූවත් ඇති හැකි පොහොසත් උදවියට උක්ත කරදරය වුවහොත් ඔවුන්ට සිංගප්පූරුවේ උක්ත කර්තව්‍යය පහසුවෙන් ඉෂ්ට කරගත හැකිය. ඒ ශල්‍යකර්මය TOP (Termination Of Pregnancy) ලෙස ජයටම කරන ව්‍යාපාරයක් වන අතර චීනයේදී නම් ඒ මැරූ කලල මනුෂ්‍යය පරිභෝජනයට (කෑමට) විකිණීමද කළ ව්‍යාපාරයකි. මා මිත්‍ර නිර්වින්දන බෞද්ධ වෛද්‍ය මිතුරා සිංග ප්පූරුවේ TOP ශල්‍යකර්මවලට විරෝධ දැක්වූ අතර, ප්‍රතිඵලය වූයේ එය වන අවස්ථාවේ ඔහුට ශල්‍යාගාරයේ ඉවත බංකුවක හාන්සි වීමටත්, මාසය අවසානයේ පඩිය අඩුවීමත් පමණකි. මේ කොරෝනා සමයේ මෙසේ  පොහොසතුන්ට පිටරට යා නොහැකි නිසා නුදුරු අනාගතයේදී TOP වලට පක්ෂව නීති ඒමට බැරි නැත. සමහර නාරි විශේෂඥ  වෛද්‍යවරු මේවා නොකරන්නේ යැයි කාට දිය හැකි දැයි නියත වියරණ? සමහර බඩ සෝදන යන ගමේ වචනයේ ශල්‍යකර්මය දී පණ ඇති සති 7, 8 හෝ ඊට වැඩි භ්‍රෑණයන් (නොමේරූ කලලයන්) කුණු කූඩයට වැටීම හෝ නොවැටීම දන්නේ දෙවියන් පමණකි. (මෙය සාතිශය බහුතරයක් වූ පිරිසිදු චේතනාන්විත හා වෛද්‍ය නිර්දේශ මත වන ශල්‍යකර්ම සඳහා අදාළ නොවේ). නීති ඇත, මවගේ ජීවිතයට තර්ජනයකි, කලලය කළ හදියක් ලෙසද සමහරුන් සිතා විද්‍යාත්මකව හා නෛතිකව සාධාරණ කළත්, දෙවිඳු නීතිය හමුවේ සාධාරණය කුමක්ද? අපි සොයන්නෙමු.

අවදිවන්න, අප මළවුන් අතරට අප යැවූ කෙනකු ඇත්ද? සංඛ්‍යාලේඛන අනුව දිනකට 1000ක් ගබ්සා වන අතර හැම කාන්තාවන් 100 දෙනකු හෝ 12ක් පමණ එයට මුහුණ දී ඇත. වැඩිහිටි හෝ මන්දමානසික දරුවන් ලොවින් ඉවත් කිරීමට අප දායක වෙමුද? ඔවුන්ගේ කුරුසියට අප සරණක් වෙමුද?

අප හැමවිටකම සමහර බටහිර රටවල අවියක් නොවියයුතු අතර, ක්‍රිස්තුස් වහන්සේ ආසියාවේ උපත ලබා යුරෝපයේ උන්වහන්සේගේ දහම ව්‍යාප්ත වුවත් ඔවුන් තුළ තිබෙන සමහර සංස්කෘතික ලකුණු ක්‍රිස්තු ලකුණු නොවේ. උදාහරණයක් ලෙස ග්‍රීසියේ එදා අංගවිකල දරුවන් ඔලිම්පස් කන්ද මුදුනට ගෙන ගොස් පහළට අතහැරියේ "සියුස් දෙවොලේ" (Zeus Mountain) ප්‍රධාන පූජකයාගේ ආශීර්වාදයෙනි. ග්‍රීසියට එදා අවශ්‍ය වූයේ පර්සියානු ආක්‍රමණවලට මුහුණ දීමට සමත් නීරෝග ජනතාවකි. එනිසා සමාජ ශුභසාධන ඔවුන් තැකුවේ නැත. අදත් එහි දිගුවක් ලෙස (Super genome project) සුපිරි මිනිසා ව්‍යාපෘතිය තවම ක්‍රියාත්මක වේ.

අප දැනගත යුත්තේ යුරෝප ම්ලේච්ඡත්වය. කිතු දහමින් ඉතාමත් සංවර වූ බව පමණකි. යුරෝපය ගැන මෙසේ ලියතත්, අප කවුරුන් හෝ නිවාඩුවට, පදිංචියට යන්න කැමතිම රටවල් ඒවා වන අතර, සමාජවාදී මුදුන් මල්කඩ යැයි කියාගත් රටවලට අප සමහර යුරෝපා විවේචකයන් යාමට ප්‍රිය නැති බවත් මතක් කරනු කැමැත්තෙමි. මැදපෙරදිග ඇති එවෙලේම කපා දාන බෙල්ල හා යුක්තියන්, ම්ලෙච්ඡත්වයේ අග්‍ර වූ අප්‍රිකානු කලාපත් අප වැඩිදුර කතා නොකරනුයේ ඒවා ප්‍රවෘත්ති වාර්තා කරණය කරන්නට ඇතැම් විට ඉඩකඩ නැත.

11 වන පිටුවට.....

**වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්**
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී උ.කො.
ශික්ෂණ රෝහල, රාගම.

# පාළුකරුගේ බලාපොරොත්තුව



'ඉතින් කොහොමද ඔබගේ ජීවිතය?' එදිනෙදා ජීවිතයේදී නිරන්තරයෙන් නොයෙක් නොයෙක් පුද්ගලයන් විසින් මේ ප්‍රශ්නය ඔබගෙනුත් මගෙනුත් අසනවා. ඒ වගේම ඔබත් මමත් නොයෙක් නොයෙක් පුද්ගලයන්ගෙන් මේ ප්‍රශ්නය අසනවා. බොහෝ අවස්ථාවලදී ඔබගේත් මගෙත් පිළිතුර වන්නේ 'මම හොඳින් ඉන්නවා' කියන දෙයයි. එහෙත් අප අපටම අවංක වී අපගේ ඇතුළත දෙස හැරී බැලුවොත් අප දුන් පිළිතුර පිළිබඳව ඔබටත් මටත් සැබවින්ම සෑහීමකට පත්වන්නට පුළුවන්ද? ඇත්තටම ඔබත් මමත් ඉන්නේ හොඳින්ද?

ජීවිතය සැබවින්ම පුදුමාකාර දෙයක්. දුක සතුට සිනහව කඳුල සමග එකට මුසු වී ඉදිරියට යන මේ ජීවිතය, නොයෙක් නොයෙක් අවස්ථාවලදී අපට අනපේක්ෂිත සිදුවීම් රැසක් අප ඉදිරියේ තබනු ලබනවා. කිසිම දිනක සිතා නොමැති, කතාවකට කියනවා වගේ හීනෙකින් වත් නොසිතූ දේවල් ඔබගේත් මගෙත් ජීවිතයේ සිදුවෙනවා. ඇතැම් විට ඒ සිදුවීම බොහෝ යහපත් ප්‍රීතිජනක වනවිට සමහරක් ඉතාමත් දුඃඛිත හිතට දරාගන්නට අමාරු වේදනාවන් එක් කරන සිදුවීම් වන්නට පිළිවන්. මොහොතක් අපි අපගේ ජීවිතය දෙස හැරී බැලුවොත් මෙය සැබවින්ම ජීවිතයේ යථාර්ථය බව ඔබටත් මටත් පසක් වනවා නොඅනුමානයි.

සතුට සිනහව සමග ජීවිතය ඉදිරියට ගෙන යන්නට මනුෂ්‍ය මට්ටමෙන් ඔබත් මමත් බොහෝ කැමැත්තක් දක්වනවා. මන්දයත් එය ඔබටත් මටත් ඉතාමත් පහසු දෙයක්. එහෙත් ජීවිතයේ අරගල ප්‍රශ්න ගැටලු පැනනගිනවිට, ලෙඩදුක් රෝග පීඩා අප වටකර ගන්න විට, නැතිබැරිකම්, පාවා දීම්, චරිත ඝාතන ඔබවත් මාවත් සිර කරන විට, ජීවිතය ඉදිරියේ ඔබත් මමත් අසරණ වෙනවා. ජීවිතය පුරා මුළු හදවතින්ම ප්‍රේම කළ පුද්ගලයන් අපගේ ඇස් ඉදිරියේ වෙනස් වන විට, ජීවිත ඉලක්ක සියල්ල හිටි හැටියේ පෙර සූදානමකින් තොරව බොඳ කරන විට, එක නීතියක් පුද්ගලයන්ට දෙආකාරයෙන් ක්‍රියාත්මක වන විට, මනුෂ්‍ය මට්ටමෙන් තිබූ අපේක්ෂා, ප්‍රාර්ථනා බිඳී යන විට කර කියා ගන්නට දෙයක් නොමැතිව ඉතාමත් අසරණ තත්ත්වයකට ඔබත් මමත් පත් වෙනවා. මෙවන් වූ අවස්ථාවල ඔබත් මමත් ක්‍රියා කරන්නේ කෙසේද?

මනුෂ්‍ය මට්ටමෙන් ලෝකයේ අප බොහෝ දෙනෙක් හුරු වී සිටින්නේ පහසුවෙන් තම ජීවිතයට ළං කර ගත හැකි සතුට සැනසීම සිනහව තුළ ජීවිතය ඉදිරියට ගෙන යන්නටයි. එහෙත් ප්‍රශ්න ගැටලු අරගල හමුවේ ඒවාට නොබියව ඉවසීමෙන් මුහුණ දෙමින් සිනහව ප්‍රීතිය ජීවිතයට එක් කර ගන්නට ඔබත් මමත් සූදානම්ද? ජීවිතයේ අරගල හමුවේ, තේරුම් ගැනීමට නොහැකි තත්ත්වයන් හමුවේ විටක මැසිවිලි නගමින්, විටක කලකිරෙමින් විටක වේදනාවෙන් තනි වෙමින් ජීවිතය දෙස ඍණාත්මකව බැලීමට පෙළඹෙන ඔබටත් මටත් අමතක වන සුන්දරම සත්‍යතාව වන්නේ අපගේ මෙලොව ජීවිතයේ ආරම්භයම වේදනාව ප්‍රීතියට හරවාගත් අවස්ථාවක් වූ බවයි.

**'ස්ත්‍රියකට ප්‍රසව මොහොත පැමිණි කල, ඈ දරු ප්‍රසූතියේ වේලාව පැමිණ තිබෙන බැවින් ඈට දරාගත නොහැකි දුක් වේදනාවක් ඇති වේ. එහෙත් ඈ දරුවා බිහිකළ පසු ලෝකයට දරුවෙක් උපන්නේය යන ප්‍රීතිය නිසා, වේදනාව අමතක කරන්නීය'** (ජුවාම 16: 21). කිතු සමිඳාණන් තම ජීවිතයේ ස්වාමියාණන් හා ගැලවුම්කාරයාණන් බව පිළිගත් කිතුනුවා තම එදිනෙදා ජීවිතයේදී අන් අය තුළින් කිතු සමිඳාණන් අත්දකින්නටත් තමා තුළින් අන් අයට කිතු සමිඳාණන් අත්දකින්නට සලස්වන්නටත් කැඳවුම් ලැබ තිබේ. ඉතින් කිතුනුවකු ලෙස අපගේ ප්‍රධානතම කැඳවුම වන්නේ තවත් ක්‍රිස්තු වරයකු වීමයි. අපගේ ස්වාමියාණන් හා ගැලවුම්කාරයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ ලෝකය තුළ ඔබටත් මටත් පැමිණෙන දුක්ගැහැට පිළිබඳව මෙසේ ප්‍රකාශ කළ සේක. **'මේ දේවල් මා ඔබට කීවේ මා තුළ ඔබට ශාන්තියක් ඇතිවන පිණිසය. ලෝකය තුළ ඔබට දුක්ගැහැට තිබේ. එහෙත් ධෛර්යවත් වන්න; මම ලෝකය**

අබිබවා ජය ගතිමි' (ජුවාම් 16:33). එසේ නම් තවත් ක්‍රිස්තු වරයකු වන්නට කැඳවුම් ලැබූ ඔබත් මමත්, ලෝකය අබිබවා ජයගත් කිතු සමිඳාණන් අප තුළ ජීවත් වන බව විශ්වාස කරන නිසාම, ජීවිතයේ ප්‍රශ්න ගැටලු, අභියෝග, අරගල පැමිණෙන විට කළයුත්තේ කුමක්ද?

බාහිර බලවේගයක් ලෙස ක්‍රිස්තුස් වහන්සේට ඔබගෙත් මගෙත් ජීවිතයට පැමිණ මේ දුඃඛිත තත්ත්වයෙන් ඔබවත් මවත් මුදා ගන්න ලෙස කන්නලවු කිරීමද? නැත්නම් තමන් තුළ ජීවත් වන ක්‍රිස්තුන් වහන්සේව නියම ආකාරයෙන් අවදි කරමින් දුක සතුටට, වේදනාව ප්‍රීතියට හරවා ගන්නට තමන් කෙරෙහි ආත්ම විශ්වාසය වැඩි කර ගනිමින්, කිතු සමිඳාණන් කෙරෙහි වූ බලාපොරොත්තුව පාළුකරය අත්දකින විටද තිර කර ගනිමින් වෙහෙස මහන්සි වී කටයුතු කිරීමද?

**නිර්මාල් අශාන් නෝනිස්**
ඉතාලියේ සිට

කුරුසියෙන්... 9 වන පිටුවෙන්.....

තවමත් ගල් ගසා මරා දමන නීතිය ශ්‍රේෂ්ඨ යැයි කියන අය එදත් අදත් සිටින අතර ප්‍රේමයේ ක්‍රිස්තු නීතිය අනුව ජීවිතවලට මරණ විනිශ්චය දීමට අප කවුදැයි අපට නැවත මතක් කර දෙයි. මානව දර්ශක අනුව තවමත් යුරෝපයේ බොහෝ රටවල් ඉදිරියෙන් ඉන්නා අතර, අප රට විශාල පවුල් සංඛ්‍යාවක් ඉතාලියේ රැකියාවලින් පෝෂණය වන බවත් සිත්හි තබා ගත යුතුවේ.

අවසානයේ ජීවිතයේ රස පමණක් සොයන මිනිසුන් සේ නොවෙමු. අප මැදිහත් වී මළවුන් වෙත කවුරුත් නොයවමු . දෙවියන් වහන්සේගේ ජීවිත, උන්වහන්සේ නියම කළ දිනට යාමට ඉඩදී දෙවිඳු කැමැත්ත ඉෂ්ට කරමු.

දුක් විඳීම නියමය නම් එය සතුටින් දැරීමට ශක්තිමත් වෙමු. අධ්‍යාත්මය ශක්තිමත් කර ගනිමු. සමාජය ඉදිරියේ ප්‍රශංසාවටත් ගෞරවයටත් වඩා දෙවිඳුන් කෙරේ ප්‍රසන්න වෙමු.

## කලාපයෙන් කලාපයට භක්තියෙන් ප්‍රබෝධනයට ලියන චුට්ටා

### බූටිකමට කියන කතා....

පාස්කු කාලයේදී ''එතෙර වීමක්'' ගැන කතා කරයි. ඒත් ඉතින් ඒ එතෙර වීම මට නම් නොතේරෙයි. එතෙර වෙන්න පාලමක් හෝ ජැටියක් කෝ? පල්ලියේ පියතුමා නම් කීවේ අපේ පව්වලින් එතෙර විය යුතු යැයි කියලාය. නමුත් අනෙක් අය කියන එතෙර වීම නම් ''ගොඩ යන'' එකට කියලා මට සිතේ. සමහරු ජීවිතේ ගොඩ දාන්න දුප්පත්කමින් එතෙර වෙන්න කියලා කුඩු විකුණති, මැරකම් කරති, මිනි මරති, දුක සේ හොරෙන් කුඩු ප්‍රවාහණය කරති, කුඩු ගැන මෙහෙම කීවට අපිත් කොච්චර කුඩු පාවිච්චි කරනවද? කුස්සියේ බෝතල්වල රතු පාට, කහ පාට, කළු පාට, දුඹුරු පාට ආදි කොපමණ කුඩු වර්ග ගණනක් කුස්සියේ රාක්කවල හංගාගෙන හොරෙන් වගේ පාවිච්චි කරනවාද? ඒත් ඉතින් ඇයි අපි කුඩු හින්ද ගොඩ ගිහින් නැත්තෙ?

සමහර අයට අරක්කු බීවම තමන්ගේ ගේට්ටුවෙන් පවා එතෙර වෙන්න බැරිය. මේ පාස්කු කාලයේ අපේ බාප්පා කෙනෙක් අරක්කු මින් පස්සේ නම් කටේ තියන්නේ නෑ කියා පොරොන්දු වී පහුවදා සිට අරක්කු බටෙන් බීවේය. අපේ බාප්පා කතාවෙන්ම මෙසේ එතෙර ගියේය. එහෙම හරි දිගටම බීවොත් ජීවිතයෙන් පවා කාටත් එතෙර වෙන්න ලෙහෙසි ය. පොඩි මිනිස්සු මෙහෙම කළාට දැන් දැන් අපේ රටේ ලොකු මිනිස්සු රටේ සම්පත් විකුණාගෙන එතෙර වන්න මාන බලති. ඒත් ඒ අය කියන්නේ රටේ සම්පත් කවදාවත්ම විකුණන්නේ නැතිය කියලාය. ඒ වෙනුවට ඔවුන් කියන්නේ එතෙර මිනිස්සු ඒවා මිලදී ගන්නවා පමණි කියාය. රටේ පාලම් හදපු උදවිය දැන් ගොඩ ගිහින් ය. අපේ වරායෙත් ජැටිය සියයට පනස් එකක්ම දැන් අයිති වරාය අධිකාරියටලු. මං හිතන්නේ අතුල අධිකාරිට ඉතිරි සියයට හතලිස් නවය අයිති ඇති. වත්ත බද්දට දී ඇස්සට දත නියවනවා කියන්නේ ඕකටලු. ඒත් ඉතින් ඒ වත්තනේ. වරාය නෙවෙයි නෙ.
ඔව් ඉතින්, පුදුම වෙන්න එපා.
අපි ඉන්නේ පුදුම ලන්තයේ නේ.
මං චුට්ටා.

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා**

# අපත් රටත් ලොවත් ප්‍රේමයේ රාජ්‍යයට නික්මයන පාදනමස්කාරයක්

## I. ක්‍රිස්තුස් වහන්සේ මරණයට තීන්දුව ලබන සේක.

ප්‍රේමයේ රාජ්‍යයට තීරණයක්

- **ජේසුගේ අත්දැකීම**

තමා ප්‍රකාශ කළ, ජීවත්වූ ප්‍රේමය, යහපත, අහිංසාව. යුක්තිය, සාධාරණය, ප්‍රේමයේ රාජ්‍යයේ ප්‍රතිපත්ති, මරණය ඉදිරියේ වුව අත් නොහරිමි, පාවා නොදෙමි.

- **අපගේ අත්දැකීම**

ජේසුව ඇණ ගැසීම එදා සිටි නායකයන්ගේ තීන්දුවකි. ඒ බරබ්බාස් නිදහස් කරනු ජේසුස් ඇණ ගසනු! මෙය ජනතා තීන්දුවක් නොවේ.

පරිසිවරු, සදිසිවරු ප්‍රජා මූලිකයන් ජේසුගේ ප්‍රතිපත්ති තමන්ට අභියෝගයක් වන නිසා ජනතාවට බලපෑම් කර ගත් තීන්දුවකි.

ජනතාවගේ අත්දැකීම වූයේ නායකයන්ගේ බලපෑමට යටත් වී තම හෘද සාක්ෂිය මග හැරීමයි.

අප අදත් කරන්නේ මේ ලෝක නායකයන්ගේ ප්‍රතිපත්ති තෝරාගැනීමද? ඔවුන්ගේ මතවාදවලට හසු වී මං මුලා වීමද?

## II. ජේසුගේ කරපිට කුරුසිය තබන සේක.

ප්‍රතික්ෂේපයේ සලකුණ වීමට

- **ජේසුගේ අත්දැකීම**

ප්‍රේමයේ රාජ්‍යයේ ප්‍රතිපත්ති උදෙසා කුරුසිය දරාගෙන යාමට තීරණය කිරීමයි.

ප්‍රතික්ෂේප වීම, කොන් වීම, කපා දැමීම, නොතේරුම් ගැනීමට අපහාසයට ලක්වීම දරාගෙන යාමයි.

- **අපගේ තීරණය**

ඔබගේ දිනපතා කුරුසිය රැගෙන මා පසු පස එන්න යන ඇරයුම පිළිගැනීමද.

දිනපතා කුරුසිය යනු මේ සමාජ ක්‍රමයට අනුව ජීවත්වීමට යාම නිසා ඇති වූ ණයතුරුස්, ප්‍රශ්න ගැටලු, ලෙඩදුක් නොවේ.

ජේසුගේ ප්‍රතිපත්ති තෝරා ගැනීම නිසා ලැබෙන දුක්පීඩා, ගැරහුම්, අවමන්, ප්‍රතික්ෂේප කිරීම්, එවැනි කුරුස බව අත්දකිනවාද?

## III. ක්‍රිස්තුස්වහන්සේ කුරුසියේ බරින් පළමුවර ඇද වැටෙන සේක.

ගත පරදා සිත පුබුදා

- **ජේසුගේ අත්දැකීම**

ජේසු දේවත්වය බදා නොගෙන මනුකය ගත් මනුෂ්‍ය පුත්‍රයා ලෙස මැජික් ප්‍රාතිහාර්යවලින් නොව දිවි ගමනින්ම ගැලවීම ලබාගත යුතු බව කියා දෙමින් මිනිස් දුබලකම නිසා කුරුස බරින් බිම වැටේ. එහෙත් දුබල ගත පරදා සිත සවිමත් කරගෙන දෙව්ඳු මග යන සේක.

- **අපගේ අත්දැකීම**

ප්‍රේමයේ රාජ්‍ය ප්‍රතිපත්ති අපි හොඳින් දනිමු. කියවා ඇත. දේශනාකර ඇත. අසා ඇත. එහෙත් අපත් මාංසයේ, ශරීරයේ ආශාවේ දුබලකමට යටවෙමු. දේව දරුකමේ ගමන අතහැර වැටෙමු. එහෙත් දේව වචනය මත පදනම්ව පර්වතය පිට ගෙය සැදීමෙන් අපට දුබලගත පරදා සිත පුබුදා ජේසු ප්‍රතිපත්ති තුළ ක්‍රියා කළ හැකිය. ඔබ දුබලගත පරදන දෙව් වදනින් පෝෂණය වනවාද ?

## IV. ක්‍රිස්තුස් වහන්සේට සිය මෑණියන් මූණ ගැසේ.

දෙව්රජය උදෙසා පවුල්බව

- **ජේසුගේ අත්දැකීම.**

තමාටත් පෙර ඔබගේ කැමැත්ත වේවායි කියවමින් මල් උයන අත්දුටු, කුරුසිය උසුලාගත් අම්මා. මව් පිය සබඳතා, ජාති, ආගම්, කුල, වංශ භේද ඉක්මවූ දේව රාජ්‍යය තුළ විශ්වීය නෑදෑකමට තමාව අවදි කළ අම්මාව දැකීම විශ්වීය ගැලවීම උදෙසා බොන්නට වන කුසලානය බොන්නට දිරියකි

- **අපගේ අත්දැකීම.**

මව්, පිය, දූදරු සබඳතාවලටත් වඩා කුලය වංශය ජාතිය පක්ෂය මුල් වී පටුකම් හිස දරා විශ්ව ගැලවුම්කාර ජේසු ප්‍රතිපත්තියට එකිනෙකාව අවදිකරනු වෙනුවට, දිරිමත් කරනු වෙනුවට ආත්මාර්ථය තුළම, තමන්ටම කොටු වූ පවුල් දිවියක් තුළම, අපේ ගැලවීම ඇතැයි සිතන ආත්මාර්ථකාමී පැවතුමක සිර වී සිටිමුද ?

මේ ලෝකයේ ගමනට නොව ප්‍රේමය

ගමනට එකිනෙකාට දිරිදෙන මව්පිය දූදරු පිරිසක්ද?

### V. සිරේනියේ සීමොන් උන්වහන්සේගේ කුරුසිය ගෙනයාමට උපකාර කරයි.

<u>බලකිරිමෙන් වුව යහපතට පෙම්බදිමු.</u>

■ **ජේසුගේ අත්දැකීම**

අනුගාමී වූවන් අත්හැර දමූ තත්ත්වයකදී ජෙරුසලමට අමුත්තෙකු වු සිරේනියේ සීමෝන්ගේ උපකාරය ජේසු ප්‍රේමයෙන් බාරගනී. කුරුසිය දරා ගැනීමට උපකාරි වීම අහම්බෙන්, සෙබළ බල කිරීමෙන් කරන්නට යෙදුණද විමුක්තිය උදාකිරිම ගමනට දායක වන මේ අමුත්තාට ජේසුගේ ආදරය මහත් බලපෑමක් වූවා නිසැකය. ජේසුගේ දහමට සියල්ලෝ උරුමකරුවෝය. ගැලවීම සියල්ලන්ටමය. ආබ්‍රහම්ගේ පුතුන්ව තෝරාගත්තාය සිතන අයට පමණක් නොවේ.

■ **අපගේ අත්දැකීම**

කිතුනුවන් ලෙස අප ප්‍රකාශ කරන්නේ විමුක්ති ගමනේ ජේසු අනුගාමිකයන් අප බවයි. එහෙත් ඇත්තටම අප මේ ගමන අප අත්හැර නැතිද? අපට වඩා අද ලොව පුරා ප්‍රේමණීය ලෝකයක් ගොඩගැනීමට කැපවී සිටින අනාගමිකයෝ අන්‍යාගමිකයෝ කොතෙක්ද? විමුක්ති ගමනට දායකවීමට ලැබෙන අවස්ථාවලට එසේය කියමු.

### VI. වෙරෝනිකා ක්‍රිස්තුස්වහන්සේගේ සිරිවත පිස දමයි.

<u>දෙවියන්ගේ වත - ස්ත්‍රිය තුළ දකිමු</u>

■ **ජේසුගේ අත්දැකීම**

ජේසුගේ පාද කඳුලින් පිසදැමූ, ජේසුගේ ඉල්ලීමට ජලය දුන්, ජේසුගේ මැදිහත්වීමෙන් අභයදානය ලද, ජේසුගේ පාද පාමුල දහම් මග විමසූ ස්ත්‍රීන්.

දෙවියන්ගේ ස්වරූපය සමානකම පුරුෂයා තුළ සේම ස්ත්‍රිය තුළද එක සමානව ජේසු දුටුවා. ස්ත්‍රීන්ගේ ආදරය ද ජේසුට පෙරළා ලැබුණා.

■ **අපගේ අත්දැකීම**

පවුල තුළ, සමාජය තුළ, සභාව තුළ ස්ත්‍රිය තවමත් දෙවැනි පුරවැසියක සේ සලකන මතවාදවල අප සිර වී සිටිමු. ස්ත්‍රියගේ මුහුණ තුළ රාගය, අනුරාගය, සුන්දරත්වය හෝ ඉන් එහාට කාමය මිස දෙවියන්ගේ වත දකින පැවැත්මක් තවම ලෝකය තුළ ගොඩනැගී නැත. ස්ත්‍රිය භාණ්ඩයක් ලෙස දකින දැක්මට විරුද්ධ ව ඔබ කුමක් කරන්නහුද ?

### VII. ක්‍රිස්තුස් වහන්සේ දෙවන වර ඇද වැටෙන සේක.

<u>වැටුණත් නැගිටිමු.</u>

■ **ජේසුගේ අත්දැකීම**

පළමු වර වැටුණු ජේසු, වැටුණු තැනම ලැග සිටියේ නෑ. නැගිට අවසානය තෙක් ප්‍රේමයේ මාර්ගයේම ගමන් ගන්නවා. වැටීමට හේතු, වට්ටවන මිනිස්සු ගැන ඇත්ත දකින ජේසු රැ වැටුණු වළේ දවල් නොවැටී සිටීමේ මාවත 'සත්‍ය' බව ලෝකයට කියා දෙනවා.

■ **අපගේ අත්දැකීම**

වැටුණු තැන්වල සිටිමින් එසේ සිටීම සාධාරණීකරණය කරනවා, ප්‍රේමයේ මාර්ගයෙන් ඉවත්වීමට නිදහසට හේතු කියනවා. වැටීමට හේතුව හරි හැටි නොදැන මිථ්‍යාව පසු පස දුවනවා. වට්ටන මිනිසුන්ගෙන්ම නායකයන්ගෙන්ම ගැලවීම පතමින් මාරුවෙන් මාරුවට රැ වැටුණු වලේ දවල් වැටෙනවා. ප්‍රේමයේ රාජ්‍යයක් උදා කිරිමෙන් තොරව සැබෑ ගැලවීමක් නැතැය යන සත්‍යය නොදැක අපි මං මුළාවේ යමුද ?

### VIII. ජෙරුසලම් ස්ත්‍රීහු හඬා වැලපෙති.

<u>හඬන්නට නොවනු පිණිස</u>

■ **ජේසුගේ අත්දැකීම්**

සැනසීම, ශාන්තිය, නිදහස, සුවය දානය කළ ජේසු කඳුළු සුසුම තවත් නැති දේව රාජ්‍යයේ උදාව සඳහා කැපවූ, ඒ කැඳවීමට ආරාධනා කළ ජේසු, ශාරීරික වේදනාව තුළ හෙම්බත්ව සිටින මොහොතක වුවද, තමා වෙත ස්ව අනුකම්පාව හෝ අන් අයගේ අනුකම්පාව ලබනු වෙනුවට සැබෑ සැනසීමේ මග වෙත යාමට 'ඔබේ දරුවන් ගැන සිතා ප්‍රේමයේ ලෝකයක් තැනීමට කැපවෙනු' යන පණිවුඩය ලබා දෙයි.

■ **අපගේ අත්දැකීම**

දවසින් දවස මත්ද්‍රව්‍යවලට, සමාජ රෝගවලට, මත්පැනට, අපරාධවලට, අපයෝජනයට, දිවිනසා ගැනීමට, හරසුන් ජීවිතවලට ගොදුරුවන දරුවන් වැඩිවෙද්දී අපත් ඊට හේතු නොසොයා. හඬ හඬා සිටිමු. බොරු ගැලවුම්කරුවන් පසු පසු යමු. දරුවන් උදෙසා යහපත් ලොවක් උදාකිරීමට පවතින අයහපත් සමාජ ක්‍රමය ප්‍රේමයේ රාජ්‍යයක් දක්වා වෙනස් කිරිමට කැප නොවෙමු. දරුවන්ගේ

ඉරණම අපගේ අපරාධය නොවේ ද ?

### IX. ස්වාමින්වහන්සේ තෙවන වරද බිම වැටෙන සේක.

වැටුණු ලොව නැගිට්වනු පිණිස

■ ජේසුගේ අත්දැකීම

දේවත්වය පසක ලා මේ පෘථිවිතලය මත ජේසු මාංස ගත වූයේ මේ අහස නව අහසක් බවට මේ පොළව නව පොළවක් බවට පත් කරන්නට බව සමිඳාණෝ ගැඹුරින් දැන සිටි සේක. වැටුණු මිනිසා නැගිටුවන්න නම් පහත් වී බිමට නැඹුරු නොවී බැරි බව උන්වහන්සේ දැන සිටි සේක. වැටීම සමිඳුන්ට දුකක් නොවන්නේ වැටීමේ අරුත උන්වහන්සේ ගැඹුරින් දැන සිටින නිසාය.



■ අපගේ අත්දැකීම

අන් අයව නොව තම සැමියා බිරිඳ දරුවා පවා නැගී සිටුවීමට පහත් වන්නට අද අප බොහෝ දෙනකුට බැරි වී ඇත. ඒ තරමට අප මහන්තත්වයෙන් බොරු මානයෙන් පිරී සිටිමු. වැටුණු ලෝකය කවුරු හෝ නැගිට්වන තුරු අපි මග බලා සිටිමු. වැටුණු ලොව නැගිටුවණු සඳහා ජේසුගේ මහ පොළවේ අරගලය තුළට පිවිසෙන්නේ නැතිව සිහින ලෝකවල සිටිමුද අපි?

### X. ක්‍රිස්තුස්වහන්සේගේ වස්ත්‍ර කඩා දමති.

සළුව නොව මෙහෙය

■ ජේසු අත්දැකීම

ජේසු ජුදා ආගමිකයකු ලෙස උපත ලබා හැදී වැඩුණෙකි. එහෙත් ජුදා ආගම විනාශ කරන ව්‍යාජ ජුදා ආගම වෙනුවට එහි පූර්ණත්වය, නීතිය වෙනුවට ප්‍රේමය, ජුදා ජාතිවාදී අධිරාජ්‍යයක් ගොඩනැගීම වෙනුවට ප්‍රේමයේ රාජ්‍යයක් ගොඩනැගීම දේව කැමැත්ත බව ප්‍රකාශ කළේය. ජුදා ආගම ප්‍රජා ජාතිය සංකේතවත් කළ නායක පූජකයාගේ සළුවට දාදු දමන සොල්දාදුවන් දැක උන්වහන්සේ ඔවුන්ට අනුකම්පා කරන සේක. සළුව, ඇඳුම උදුරාගත්තද සැබෑ පූජක මෙහෙවර උදුරා ගත නොහැකි බව උන්වහන්සේ දනිති.

■ අපගේ අත්දැකීම

අපි කිතුනුකම රැකගැනීමට හෙවත් සළුව වෙනුවෙන් වෙහෙසෙන තරමට කිතුනුකම හෙවත් ප්‍රේම රාජ්‍යයත් බිහි කිරීම් මෙහෙවරට කැප නොවෙමු. මංගල්‍ය උත්සව ආදියට කරන වැය කිරීම් කැපකිරීමවලින් අංශුවක් යුක්තිය සාධාරණය ප්‍රේමය පිරුණු ලොවක් ගොඩනැගීමට වැය නොකරමු.

සළුව නොව මෙහෙවර සඳහා කැපවීම සඳහා සළුවට දාදු දමන සොල්දාදුවන් වීමෙන් මිදෙමුද ?

### XI. ක්‍රිස්තුස් වහන්සේව කුරුසියේ ඇණ ගසති.

■ ජේසුගේ අත්දැකීම

ජේසුගේ අවධානය ඇත්තේ ගලා යන රුධිරය ගැන නොවේ. ගසා ඇති ඇණ ගැන නොවේ. ඔටුන්නේ ඇති කටු ගැන නොවේ. ශරීරයේ ඇති තුවාල ගැන නොවේ. තව කෙනකුගේ අණට අනුව වැඩ කිරීම වෘත්තිය කරගත් හෘදයසාක්ෂියට ඉඩක් නැති රස්සාවක් කරන සෙබළුන් ගැනය. තමාව ඇණ ගැසීමට ක්‍රියා කරන නොමග ගිය පිරිස් ගැනය. ඊට දායක වූ අසරණ කරන ලද ජනතාව ගැනය. තමාගේ දූත කාර්යය ගැනය. ජේසුස් වහන්සේ නොකඩව යදින්නේ 'ස්වාමීනි මොවුන් කරන දෙය නොදනිති. ඔවුන්ට සමාව දෙන්න' යනුවෙනි.

■ අපගේ අත්දැකීම

අප නිතර අවධානය දෙන්නේ ලේ වැල්, තුවාල වණ කැළැල්, හෝ ඒවා කරන අය දෙසය. ඔවුන් එතැනට පත් වූ හේතු දෙස නොවේ. ඒ නිසා අපි නිතර වෛරයෙන් වේදනාවෙන් සිටිමු. සමාව දීමට නොහැකි ව සිටිමු. දුක්කරදරවල තරම ගැන වැලපි අසතුටින් සිටිමු. ජේසු මෙන් වීමට තීරණය කරමු. හේතු සොයා අසරණයාට, පව්කරුවාට සමාව දෙමු. ජනයා අසරණ කරන පාපිෂ්ඨ ලෝක ක්‍රමය වෙනුවට ප්‍රේමයේ රාජ්‍යය ගොඩනැගීමට කැප වෙමු.

## XII. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ කුරුසියේ උකුත් වන සේක.

අවසන් හුස්ම නොව ජීවිතය බාරදෙමු.

- **ජේසුගේ අත්දැකීම**

උන්වහන්සේ දෙවියන්ගේ හස්තයට බාර දුන්නේ අවසන් හුස්ම නොවේ. උන්වහන්සේගේ මුළු ජීවිතයමයි. ඒ බාරදීමේ කූට ප්‍රාප්තිය ප්‍රකාශ කිරීමකි. මාගේ ප්‍රාණය ඔබට බාර දෙමි යන මේ වචන. දේව තාත්තා දුන් ජීවිතයට ඇති මෙහෙවර උන්වහන්සේ සම්පූර්ණ කරන සේක. තෘප්තිමත් අවසානයක් දෙවියන්ද අත්හළ බව සිතෙන මොහොතක අහස පොළව අතර එල්ලී සිටින මොහොතක 'සියල්ල සම්පූර්ණ බව' දැකීමේ පූර්ණත්වය උන්වහන්සේගේ අත්දැකීමයි.

- **අපගේ අත්දැකීම**

ජීවිත කාලය පුරා පවතින පාරිභෝගික බහු භාණ්ඩික මුදල ධනය නම් රන් වස්සාව වන්දනා ක්‍රමයට ජීවිතයම කැප කර මැරෙන මොහොතේ ප්‍රාණය බාර දෙන කිතුනු ජීවිතයක් ගත කිරීම අපේ ඇත්ත තත්ත්වය නොවේද ? නහින දෙහින කාලේ දෙවියන්ට ළං වීම යනු පණ නල තියෙන කාලේ ලෝකයේ ක්‍රමයට කැපවීම නොවේද ? සියල්ල සම්පූර්ණ යැයි අප කියන්නේ මේ ලෝකයේ අවශ්‍යතා ඉටු වූ පසු නොවේද ?

දෙවියන් තුළ පූර්ණ වීමට මේ ලෝකය තුළ හිස්වීමට මේ ලෝකයට විකාරයක් වන කුරුසියේ ප්‍රඥාවට ඇතුළු වෙමු.

## XIII. ක්‍රිස්තුස් වහන්සෙගේ සිරුර දේව මාතාවන්ගේ උකුළට

මරියතුමිය වගේ වනු පිණිස

- **මරිය තුමියගේ අත්දැකීම**

ජේසුගේ අත්දැකීම වූයේ දේව කැමැත්තට ආරම්භයේ සිටම උන්වහන්සේව සූදානම් කරන ගර්භාශයක මාංසවත්ව හැදි වැඩීමයි. මරිය තුමියගේ අත්දැකීම වන්නේ තමා දුටු මෙහෙවරද සම්පූර්ණ වී ඇති බවයි.

නින්දාවට අපහාසයට ගල් ගසා මරණයට බිය නොවී තම කුස දෙව් පුතුව මාංසවත් වීමට දීම යනු විශ්ව මාතාවක වීමේ මෙහෙවරට පණ දීමක් බව එතුමිය දැන සිටියාය. ඒ මෙහෙවර තුළ තව දුරටත් යාමට එතුමිය පුතුගේ ශ්‍රාවකයන්ට සහාය වන්නීය යැයි අදිටන් කරන්නීය. බලාපොරොත්තුවේ දැස් දල්වා සිටින්න.

- **අපගේ අත්දැකීම**

දෙවියන් දුන් දරුවන් යයි පුරුද්දට කීමත් ගිහි වේවා, පැවිදි වේවා, පූජක වේවා අපේ දරුවන් මේ ලෝකයේ විරුවන්, මහ මිනිසුන්, ලොකු තනතුරු දරන්නන් වනු මිස දෙව් රජයේ මෙහෙකරුවන් වීම අපගේ අපේක්ෂාව නොවන්නේ යැයි වචනයෙන් කීවද අප පතන්නේ මේ ලෝකයේ විශිෂ්ටත්වයයි.

ජේසුස් වහන්සේගේ දිව්‍ය හෘදයට මරිය තුමියගේ නිර්මල හෘදයට යදිමින් අප ඉල්ලා සිටින්නේ එවන් හදවතක් කැපවීමක් වැය වීමක්ද ?

## XVI. ක්‍රිස්තුස්වහන්සෙගේ සිරුර සොහොනේ තැන්පත් කරනු ලබයි.

මරණයේ නොව ජීවිතයේ මිනිසුන් වන්න

- **දේව පුත්‍රභාවයේ අත්දැකීම**

අබ්බා තාත්තා කියා අමතන පුත්‍ර බව මිස දාස බව නොවේ, ජේසු අත්දුටුවේ. සමිඳාණන් අත්දුටුවේ ජීවිතයයි. ජීවනයයි. හිස තබා ගන්න තැනක් නැති කාලකණ්ණිකමින් නොවේ. මා ආවේ ජීවනය දෙන්නයි. වැඩි වැඩි වැඩියෙන් දෙන්නයි කීවේද දෙවියන් මරණය නොව, ජීවිතයේ දෙවියන් කීවේද ඒ අත්දැකීම තුළයි. පල දරනු පිණිස වැටී මිය යාමේ සනාතන දහම උන්වහන්සේ දුටු සේක.

- **අපගේ අත්දැකීම**

අපි උත්ථානයත් නැති සදාතන චතාරිකයක සිටින්නන් සේ දිවි ගෙවනු නැතිද ? ලෙඩදුක් පීඩා රැසක සුලමුල මේ ක්‍රමය තුළ පැවැතීමේ ව්‍යාජ ජීවිත අරගලයේ මානසික පීඩාව නොවේද ? අපගේ ජීවනයම ඔබ වේ කිව්වාට අප ජීවිතය සොයන්නේ පවතින ක්‍රමයේ 'ආස්වාදන' තුළ නොවේද' ? මරණයේ විෂම චක්‍රය වෙනස් කර ජීවිතය දෙන ලෝකයක් සඳහා ජීවිතය දීමෙන් තොර උත්ථානයක් නැති බව හදවතේ ලියා ගනිමු. මැරි මැරී ජීවත්වීමේදි ජීවත්වීම තුළ මිය යන්නට තීරණය කරමු. ප්‍රේමයේ රාජ්‍යය සියල්ලට පළමුව සොයන, නික්මයාම හුදු පෞද්ගලික ගැලවීමෙන් ඔබ්බට මරණයේ සමාජ ආර්ථික ක්‍රමයකින් ජීවිතයේ ප්‍රේමයේ සමාජ ආර්ථික ක්‍රමයකට නික්මයාමක් බවට අලුත් බව්තිස්මයක් සඳහා කුරුසියේ අලෝකය ලබමු.

මහින්ද නාමල්

# විමුක්තියේ දෝංකාරයයි එය, අද දවසේ ජේසු වන්නට ඇරයුම් කරන !

සිහිනයකි එය, මා තැති ගැන් වූ, මා කැළඹ වූ,
මා අභියෝගයට ලක් කළ...
පෙනී සිටියහ දෙවිඳාණෝ අන්ධ, අඳුරු
ගොරබිරම් උස් අහසක ධවල පැහැ දීප්තිමත්
ආලෝකයක් ව...

උන්වහන්සේ මෙසේ වදාළ සේක.
''තවත් නිහඬ ව සිටින්නේ මන්ද?
සකල ජාතීන් වෙත ගෙන යන්න මේ
පණිවිඩය...
ලිවිය යුතු ය ඔබ... හඬ නැගිය යුතු ය ඔබ...
බලකාමයේ, තණ්හාවේ, මිථ්‍යාවේ
දුෂ්ට උදම් රළින්
ප්‍රේමයේ සහ සාමයේ ජීවිතය
මැකී නොයනු පිණිස...''

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක.
''සාමය ද, සතුට ද, ආදරය ද සමඟ සම්බන්ධව
ජීවත් වනු පිණිස
මේ මිහිමතට මා එවූ මගේ දරුවන් ම එරෙහි
වූහ මා පෙන්වා දුන් ජීවිත දහමට
ධන කාමයෙන්, බල කාමයෙන් අන්ධ වූ
ඔවුහු වැනසූහ ඔවුන්ගේ නිවහන ම
මන්ද පෝෂණයෙන්, සාගින්නෙන් මිය යනු
පිණිස මගේ දරුවන් ඇද දැමූහ,
දරිද්‍රතාවේ රුදුරු අගාධයට...
මෙතරම් පාපිෂ්ඨ ජාතියක්, අපරාධයෙන් බර
සෙනගක්, නපුරු ලෙස ක්‍රියා කරන
දුෂ්ට පරපුරක් වූයේ කෙලෙසින් ද ඔබ...''

''නොපෙනේ ද ඔබට,
දුඃඛිතභාවයේ, අසරණභාවයේ
රළු කටුක බිම සිට ඔබේ ම සොයුරු සොයුරියන්
නගන හඬ...
ආහාර, වස්ත්‍ර, හිසට සෙවණ,
පානය පිණිස පිරිසිදු ජලය
ඉගෙනුමට ඇති අයිතිය, සුදුසු ජීවන වෘත්තියක
නියැලෙනු පිණිස ඇති අයිතිය,
මිනිසුන් ලෙස ගෞරවය,
ආදරය, රැකවරණය ලබමින්
නිදහස් ව දිවි ගෙවන්නට ඇති අයිතිය
අහිමි කර ඇත ඔවුන් වෙතින්...''
''මිනිස් නිදහස උදෙසා සටන් කළ
ඔබේ සොයුරු සොයුරියන්
මරා දමා ඇත, අතුරුදන් කර ඇත
මොර ගසයි ඔවුන්ගේ ලෙය මවෙත
මහ පොළවේ උණුහුම් පපු කුහරයෙන් නැගී
සිටින්නේ කෙලෙසද ඔබ නැසූ කන් ව....''

''ඔබේ පාලකයෝ ඔබේ ම සතුරෝ ය
ඔවුන් සොරුන්ගේ මිතුරෝ ය
සියලු දෙන ම අල්ලසට, වංචාවට ළැදි ය
ඔවුන් වැඩ කරනුයේ තම වාසිය සඳහා ම පමණි
පීඩිතයන් වෙනුවෙන්
ඔවුන් කිසිදින යුක්තිය ඉටු කරනු නැත.
ඔබේ කතිරය ඔවුන්ගේ රාජකීය ඔටුන්න වී
ඔබේ සිරසට කටු ඔටුනු පළඳවා ඇත
ඔබේ බුද්ධිය ද, මනුෂ්‍යත්වය ද, සංවේදී බව ද
සිදුරු වූ සිරසින් රූරා ගලා යනු පිණිස
තව තවත් සිර කරති ඔවුන් සිතූ ලෙස...
නිදහස් අදහස් අහිමි වූ, මාධ්‍ය බලවතුන්ගේ
රූකඩයට නැටවෙන
වහලුන් වී ඇත ඔබ සැම...''

සමිඳාණෝ මෙසේ වදාරණ සේක.

''නුඹලාගේ නිමක් නැති පූජා, ගැයුම් යැදුම්වලින්
මට පලක් වේද
මා නමින් ඉදිවන මහා මාළිගා කුමකට ද මට
විශ්වය ම මගේ මන්දිරය වූ කල
යහගුණැති දිළිඳු හදවත්
මගේ වාසස්ථානය වූ කල
විමුක්තියේ සුබාරංචිය ඉපදුණු බව අමතකද
කුඩා ගව හලක...
ඔය නිෂ්ඵල පූජා තවත් නොගෙනෙන්න
දුම් පූජා මට ඉවසිය නොහැකි ය.
මහා මංගල්ල ද, වීදි පෙරහැරවල් ද, ආගමික
උත්සව ද මට රිසි නැත.
නුඹලාගේ පාපවලින් ඒවා දූෂණය වී ඇත.''

''සාගත වසංගත බිය මැද අසරණව සිටින
මගේ ජනයා වෙත නෙත් හෙළන්න.

බලන්න,
සිය දරුවන්ට අහර වේලක් දිය නොහැකිව
අසරණව සිටින ඔවුන්ගේ දෑස් දෙස
නවීන තාක්ෂණය මුවාවෙන් උදුරා ගත්
දරුවන්ගේ අධ්‍යාපන අයිතිය වෙනුවෙන්
බලාපොරොත්තු විරහිත
හිස් ඇසින් බලා සිටින මව්පියන්...

විරැකියාවෙන් පීඩිතව තැන තැන
වැළපෙනා තරුණ දරුවන්...
කවුරුන්ද පෙනී සිටින්නේ ඔවුන්
වෙනුවෙන්

අසන්න,
දියුණු යැයි උදම් අනන
ලොව තුළ හුස්ම පොද වෙනුවෙන්
යදිමින් මිනිසුන් මිය යන හඬ
ගමින් ගම, දොරින් දොර
පීඩිතභාවය
සිය රුදුරු යදමින් සිර කර ඇත
මිනිසුන්ගේ ගෙල මුළුමනින් ම....''

''කුමක් කළේ ද ඔබ ඔවුන්
වෙනුවෙන්
ඒ ඔබේ සොයුරන් ය...
සොයුරියන් ය...
යුක්තිය ඉටුවනු පිණිස
ඔවුන් වෙනුවෙන් හඬ නගන්න.''

මගේ ජනතාව බඳු බරින් පෙළාලන
පාලකයන් හට එරෙහි වන්න.
ස්වකීය සුඛ විහරණය
පමණක් ම සලකන
ධනවතුන්ගේ, බලවතුන්ගේ
ඇස් ඇරෙනු පිණිස
නැගී සිටින්න...
හඬ නගන්න.
විමුක්තියේ සුබාරංචිය
දොරින් දොර, ගමින් ගම,
නුවරින් නුවර
ගෙන යනු පිණිස
අත්වැල් බැඳගන්න.

අද ජේසු ඔබ වෙන්න.
අද ජේසු වී ඔබ යළි යළිත්
උපදින්න.''

(යෙසායා දිවැසිවරයාගේ යැදුමින්
අනුප්‍රාණය ලැබීමි. යෙසායා දිවැසිවර
වැකි යළි යළිත් කියවන්නැයි, එකී
දිවැසි හඬ යළි යළිත් අසන්නැයි
ඔබට ඇරයුම් කරමි.)

**තරංගනී රෙසිකා ප්‍රනාන්දු**

# පාළුකරයේ බලාපොරොත්තුව

සිතේ දුක සිරවෙලා ඉකියක නෙතින් වැගිරෙන කඳුළැලි
මාව ඔබ අත්හැර දැම්මදෝ සිතේ ඉපදෙන සිතුවිලි
කතර නිරුදක සේම දිවිමග විටදි ගතවන වියැළිවී
මොරගසන මා සිතද හදවත යදිමි ඔබවම සමිඳුනී

මම මගේ යැයි බදා අල්ලා සුරැකි නෑසිය හිතවතුන්
අතැර එරෙහිව වෙන්ව ගියදා දමා මා සිත තනිකමින්
දිවිය කතරකි පාළුකරයකි ඇසේ සමිඳුනි ඔබ හඬින්
මගේ උරුමය ඔබයි පුතුනේ ඉන්න ඇවිදින් මා ළඟින්

සුළඟ රළු වී සයුර කැලඹී ගර්ජනා කරනා ලෙසේ
දිවිය සසැලී විලාපය දී හඬන්නට කියනා වෙලේ
වෙර සිඳී සිත කලල් දිය මත ගිලෙන්නට හදනා කලේ
දිරිය දෙන හඬ ආදරෙයි මං ලෝකයට වැඩියෙන් පුතේ

සතුට සොම්නස සේම කඳුළද එනව දිවියට නොකියම
මිනිසියාවට තුටු නොවන දා දැනේ ගිනියම උදුනක
සමිඳුනේ ඔබ ඉඩ හැරියා නම් එන්න ඒවට නොගොසින
කමක් නෑ මට දනිමි සමිඳුනි ඔබගෙ ප්‍රේමය මට ඇත

**ගංගා රුවන්ති රූපසිංහ**
හංවැල්ල

## අමිතගේ හද ගැස්ම......



# ශුද්ධ වූ සතිය අර්ථවත් කරමු.

**ශුද්ධ වූ සතිය**

කිතුනු අපගේ උතුම්ම මංගල්‍යය වන පාස්කු මංගල්‍යය සිදුකරන්නට අපි මේ දිනවල සූදානම් වෙමින් සිටිමු. ක්‍රි.ව. තුන්වන ශත වර්ෂය වන විට ශුද්ධවූ සභාව තුළ ශු. සතිය ඇරඹුණු බව පැවසේ. දුඃඛෝත්සව ඉරුදින හෙවත් ගොබ් ඉරුදිනෙන් ශු. සතිය ආරම්භ වේ. ක්‍රිස්තුස්වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය සුපරිස්මරණය කරන මේ සතිය අපගේ දේවවන්දනා වසරේ ඇති අති උතුම් වූ සතියයි.

ජේසුස් වහන්සේ මෙලොව කළ කී දේ සියල්ල මානව සංහතිය ගලවා ගැනීම සඳහාය. එබැවින් ජේසුස් වහන්සේට මෙලොව ජීවිතයේ අන්තිම සතියේ සිදු වූ සියල්ල අපටද කිසියම් ආකාරයකට මුහුණ දෙන්නට සිදු වේ. ක්‍රිස්තුන් වහන්සේ වඩා ප්‍රේමාන්විතව මේ දිනවල අප තුළ ජීවමාන වන සේක.

**ගොබ් ඉරුදින :-**

තාල අතු හෝ ගොබ් අතු ආසිරි ගන්වා ඒවා රැගෙන පෙරහැරකින් මහත් ජයෝත්සවයෙන් දේවස්ථානයට ඇතුළුවීම මගින්, ක්‍රිස්තුන් ස්වාමීන් වහන්සේ ස්වකීය පාස්කු අභිරහස ඉටු කිරීම සඳහා ජෙරුසලෙම් නුවරට ඇතුළුවීම සාන්ත සභාව උත්සවාකාරයෙන් මෙදින සිහිකරයි.

කිතුසමිඳාණන් අප උදෙසා තමන්වහන්සේව, හිස්කර ගනිමින් සේවකයකු ලෙස මරණයට පත්වී උත්ථානය තුළ ජීවිතයක් මිනිස් සංහතියට උදාකර දුන් රජාණන් හා ගැලවුම්කරුවාණන් ලෙස මෙදින අපි උන්වහන්සේ පිළිගනිමු. එදා ජුදා ජනතාව, පැතූ තමන් බලාපොරොත්තු වූ රෝම පාලනයෙන් නිදහස් කරන දේශපාලනමය කුමාරයකු නොව, සැබෑ ගැලවීමත්, විමුක්තියත්, පාපයත් නිදහස දෙන රජකු දකින්නට මෙදින සාන්ත සභාව අපට ඇරයුම් කරන්නීය. එම රජ කමට, දුක් විඳීම හා මරණය පංගුකාර වන හෙයින් සමිඳාණන්ගේ රාජකීයත්වයට උරුම කියන අපිදු මෙම සතිය තුළදී එම දුක් විඳීමට මරණයට සහභාගී වන්නට සූදානම් විය යුත්තෙමු.

**තෛලාශීර්වාදිත පූජා මෙහෙය**

ශුද්ධවූ තෛලය ආශීර්වාද කරනු සඳහා පැවැත්වෙන මේ පොදු පූජා මෙහෙය රදගුරුතුමන් හා පදවියේ පූජක පිරිස අතර ඇති සුහද ඒකත්වය පිළිබිඹු කරන මහඟු අවස්ථාවකි. මෙය පෙරදී මහ බ්‍රහස්පතින්දා පෙරවරුවේදී පැවැත්වූවත් කාලෝචිතව ශුද්ධවූ සතියේ සඳුදා, අඟහරුවාදා හෝ බදාදා දිනවලින් පහසු දිනක ඒ ඒ පදවි තුළ පවත්වනු ලබයි. පදවිය භාර රදගුරුතුමන් හා ඒ පදවියේ සේවය කරන පූජක උතුමන්ලාගේ සහභාගිත්වයෙන් පැවැත්වන මේ දේව මෙහෙයේදී රදගුරුතුමා සිය පූජකතුමනට අනුශාසනා කරමින් සැදැහැවතුනට කරන සේවයේදී විශ්වාස පක්ෂ පැවැත්මකට ඔවුන් දිරිගන්වයි. තමන්ගේ පූජක භාර අලුත් කරන්නට මේ අවස්ථාවේදී එතුමෝ සියලු පූජකවරුන් කැඳවති.

මෙදින කෙරෙන තවත් වැදගත් කාර්යයක් වනුයේ තෛලය ආශීර්වාද කිරීමේ පිළිවෙතයි.

- ශුද්ධවූ ක්‍රිස්මා තෛලය (The Sacred Chrism Oil - S.C.) - මෙය ප්‍රසාද ස්නාපනයේදී, අභිවෘද්ධි ආලේපයෙදී හා පූජකවරයේ සක්‍රමේන්තු දානය කිරීමේදී භාවිත කරයි.
- රෝගීන් සඳහා වූ තෛලය (The Oil of the Sick - O.I.) - මෙය රෝගීන්ගේ ආලේපය දානය කිරීමේදී භාවිත කරනු ලබයි.
- ආධුනිකයන් සඳහා වූ පූර්ව ප්‍රසාද ස්නාපන තෛලය (The Oil of the Catechuman - O.C.) - ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී භාවිත කරනු ලබයි.

මෙදින ආශීර්වාද කරන ශුද්ධ වූ තෛලය වසර පුරා ප්‍රසාද නිධාන දීමේදී භාවිත කරනු ලබයි.

**මහ බ්‍රහස්පතින්දා**

සමිඳාණන්ගේ අන්තිම රාත්‍රී භෝජනය සිහිපත් කරන මෙදින දිව්‍ය සත්ප්‍රසාදය සහ නිල පූජකවරය සක්‍රමේන්තු ස්ථාපිත කිරීමද සිහිපත් කරනු ලබයි. මිනිස් සංහතියට සමිඳාණන් පෑ උත්තරීතර ප්‍රේමයේ සිහිවටනයක් ලෙස, තමන් සිරි සිරුර හා රුහිර දානය කිරීමත් **මා නුඹලාට ප්‍රේම කළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරන්න යන උතුම් වූ ප්‍රේමයේ පණත දානය කිරීමත්** මෙදින සිහිකරන අතර එමගින් සහෝදර දයාව සේවය උන්වහන්සේගේ සේවකභාවය ප්‍රකාශ

කෙරෙන පාද ධෝවනය ගැනද සාන්ත සභාව අප අවධානය මෙදින දේවවන්දනාව තුළින් යොමු කරයි. සාමාන්‍යයෙන් මේ මෙහෙය හිරු බැසගිය පසු පැවැත්වේ.

■ මෙදින දිව්‍ය යාගයේදී ''සුරදූත ගීය'' එනම් ස්වර්ගයේ දෙවියන් වහන්සේට යන්න ගායනා කරන අතර සීනුවද නාද කරනු ලැබේ. ඉන්පසු පාස්කු පූර්ව රාත්‍රී මෙහෙයේදී නැවත සීනුව නාද කරන තෙක් සීනුව නාද කරනු නොලැබේ.

■ සාමාන්‍යයෙන් පාද ධෝවනය කරනු ලබන්නේ දේශනාවෙන් පසුවය. මේ අවස්ථාවේදී පිළිවෙතේ දී ඇති හෝ අවස්ථාවට උචිත වෙනත් ගීතිකා ගායනා කළ හැකිය.

■ දිව්‍ය පූජාවෙන් පසු සත්ප්‍රසාද නිවහනේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තබනු නොලැබේ. අල්තාර රෙදි ඉවත්කර, සත්ප්‍රසාද නිවහන විවෘතව තබයි. මහ සිකුරාදා දේව මෙහෙයේදී දානය කරනු ලබන දිව්‍ය සත්ප්‍රසාදය පෙරහරින් වැඩමවාගෙන සකසා ඇති මණ්ඩපය වෙත ගෙන යනු ලැබේ. මේ අවස්ථාවේදී ''ජය හඬින් සිරි දේහේ'' යන ගීය හෝ වෙනත් උචිත ගීතිකාවක් ගායනා කරනු ලැබේ. සත්ප්‍රසාද වහන්සේ මණ්ඩපයේ වැඩමකර දුම් පුදා ''ආ උතුම් මේ අභිරහස'' ගායනා කර යැදුම් මෙහෙය ආරම්භ කරයි. මේ යැදුම් රාත්‍රියේදී මූලික වන්නේ ජීවමානව වැඩ සිටින දිව්‍ය සත්ප්‍රසාදයේ සමිඳාණන් වන්දනා කිරීමට වඩා එදා අන්තිම රාත්‍රී භෝජනයෙන් පසුව පේදුරු, ජුවාම්, ජාකොබ් සමඟ ''ගෙත්සමනට'' ගිය ස්වාමින් වහන්සේගේ බියකරු ශෝකජනක අත්දැකීම සමග ඒකාත්මික වෙමින් මධ්‍යම රාත්‍රිය දක්වා යාච්ඤා කිරීමයි.

## මහ සිකුරාදා

මෙදින සවස තුනට පමණ සමිඳාණන්ගේ මරණයේ දුඃඛෝත්සවය පවත්වනු ලැබේ. මෙදින මෙහෙය,

1. දේව වාක්‍යයේ මෙහෙය
2. ශ්‍රී කුරුස වන්දනා මෙහෙය
3. දිව්‍ය සත්ප්‍රසාද දානය කිරීමේ මෙහෙය

යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

කුරුසියෙන් වූ මහ ගැලවීමේ අභිරහස කෙරෙහි ගැඹුරු ලෙස මෙනෙහි කිරීමකට යොමුකරන මහ සිකුරාදා අතීතයේ දී දුක්බර දිනයක් ලෙස සැලකුවත් මහත් ජයග්‍රාහී දිනයක් ලෙස අද අපට සාන්ත සභාව ඉදිරිපත් කරන්නීය.

ජේසු සමිඳාණන්ගේ කුරුසියේ මරණය ගැන කනගාටු වූවත් කුරුසියෙන් ලොවට ගෙන දුන් ගුණාත්මක අර්ථයත්, එහි අභ්‍යන්තර බලයත් ගැන මොහොතකට හෝ සිතන්නට, සාන්ත සභාව මතක් කර දෙන්නීය. එනම් කුරුසිය තුළින් මිනිස් සංහතිය ලැබූ විමුක්තියත් ගැලවීමත් සිහිපත් කිරීමට ඇරයුම් කරන්නීය.

අප වෙනුවෙන් ජීවිතය පූජා කළ ක්‍රිස්තුන් වහන්සේට කැපවීමේ සලකුණක් ලෙස පියතුමා මෙහෙය ආරම්භයේදීම අල්තාරය ඉදිරිපිටට පැමිණ ආචාර කොට මුණින්තලා වැටෙන අතර සියල්ලෝ දණගසාගෙන ඉතා සුළු වේලාවක් නිශ්ශබ්දව යාච්ඤා කරති.

පොදු යැදුමින් පසු **දේව වාක්‍ය මෙහෙය ඇරඹේ.** මෙහිදී දෙවියන් වහන්සේගේ පොරොන්දුව හා ගැලවීමේ සැලැස්ම තුළ මෙසියස් වන දෙවියන් වහන්සේගේ දුක් විඳින සේවකයාට ලබා දෙන්නාවූ ජයග්‍රහණය මේ දේවප්‍රකාශන තුළ පැහැදිලි කරයි.

දේශනාවෙන් පසුව විශ්වාසකයන්ගේ යාච්ඤා ආරම්භ කෙරේ. පූජාප්‍රසාදිතුමා සිය අසුන ළඟ හෝ දේව වාක්‍ය පීඨය අසල හෝ සිය දෙඅත් වැඳගෙන යාච්ඤාවේ අරමුණ ආරම්භ පාඨය කියවයි. ඉන්පසු සුළු මොහොතක් සියල්ලෝ නිශ්ශබ්දව යාච්ඤාවේ යෙදෙති. ඉන්පසු පූජාප්‍රසාදිතුමා දෙඅත් විහිදා යාච්ඤාව ගයයි. මේ යාච්ඤා මෙහෙය පුරාම විශ්වාසකයනට දණගැසීමට හෝ නැගිට සිටීමට හෝ හැකිය.

ශුද්ධ වූ සභාව උදෙසා, ශුද්ධෝත්තම පියාණන් උදෙසා, ශුද්ධ වූ සභාවේ ගිහි පැවිදි සියල්ලන් උදෙසා, ධර්මාපේක්ෂකයන් උදෙසා, සභා සමගිය උදෙසා, යුදා ජාතිකයන් උදෙසා, ක්‍රිස්තුන්වහන්සේ තවමත් නොහඳුනන අය උදෙසා, දෙවියන් නොඅදහන අය උදෙසා රාජ්‍ය පාලකයන් උදෙසා හා නොයෙක් උවදුරින් පෙළෙන්නන් උදෙසා යාච්ඤා කිරීම විශේෂත්වයකි.

## ශ්‍රී කුරුසියේ වන්දනා මෙහෙය

කුරුසිය, දුක වේදනාව සංකේතවත් කරයි. එය වරදෙහි ඔප්පු සාක්ෂියකි. එහෙත් සකල මිනිස් සංහතියේම ජයකුන්තය ලෙස කුරුසිය ඉදිරිපත් කරන සාන්ත සභාව ජේසු සමිඳුන්ගේ බැහැපත්කමත් කීකරුකමත් තුළ සමාවේ හා

කරුණාවේ මහ ජයටැඹ ඒ කුරුසියම වන බව අනාවරණය කරන්නීය. මෙනිසා කුරුසිය වන්දනා කිරීම මෙදින දේවවන්දනාවේ වැදගත් අවස්ථාවක් වන්නේය. කුරුසිය වැඩමවන ආකාර දෙකකි. ඉන් එක ක්‍රමයක් මෙලෙස සඳහන් කරමි.

පූජාප්‍රසාදිතුමා හෝ තේවාචාරීවරයකු හෝ සහයකයන් සමග දේවස්ථානයේ ප්‍රධාන දොරටුව වෙත යයි. එහිදී රෙදි කඩකින් වසා ඇති කුරුසිය අතට ගෙන දැල්වෙන ඉටිපහන් ගත් සහායකයන් දෙපසින් ඇතිව දෙව්මැදුර මැදින් ශුද්ධ මණ්ඩපය කරා පැමිණෙයි. මහදොර ලඟදී ද දෙව්මැදුර මැද්දී ද ශුද්ධ මණ්ඩපයට ඇතුළු වන තැන දී ද නැවතී කුරුසිය ඔසවා ''කුරුසියේ ගස මේ බලව්'' යන්න ගයමින් සැදැහැවතුන් වන්දනාවට කැඳවයි. සැදැහැවත්හු ''ක්‍රිස්තුනි ඔබට නමස්කාර කර....'' යන්න ගයමින් පිළිතුරු දී දණ ගසා සුළු මොහොතක් නිශ්ශබ්දව වන්දනා කරති. මෙය තෙවරක් කරනු ලැබේ. ඉන්පසු ශුද්ධ මණ්ඩපයට ඇතුළු වන තැන කුරුසිය තබා දැල්වෙන ඉටිපහන් දෙක ද දෙපස තබවයි. ඉන්පසු පූජාප්‍රසාදිතුමා කුරුසිය සිපාචාර කරයි.

## දිව්‍ය සත්ප්‍රසාද දානය කිරීමේ මෙහෙය

දිව්‍ය සත්ප්‍රසාද මෙහෙය සඳහා පූජාසනය මත සුදු ඇතිරිල්ලක් දමා ශුද්ධවූ ලේන්සුව හා පොත් තබනු ලැබේ. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කිරීමෙන් පසු පූජාප්‍රසාදිතුමා පූජාසනය වෙත පැමිණ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ගරු කොට, ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව උච්චාරණය කිරීමට ජනතාවට ආරාධනය කරයි.

අනතුරුව පෙර දින තැන්පත් කළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මෙදින දානය කරනු ලැබේ. මහ බ්‍රහස්පතින්දා උන්වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රී ශරීරය හා රුධිරය පූපය තුළ සංකේතවත් කරමින් අප උදෙසා උන්වහන්සේ ජීවිතය පූජා කළ සේක. රුධිරය වගුරුවාලූ සේක. එමගින් එදින දිව්‍ය භෝජනය තුළ උන්වහ්නසේ සංකේතාත්මක මරණය පෙන්වාලූ සේක. ඒ මරණය පසුදින එනම් මහ සිකුරාදා කුරුසිය මත තම ප්‍රාණය පූජා කරමින් තහවුරු කළ සේක. මහ සිකුරාදා තමන් පවරා දුන් ඒ ප්‍රේමයේ ජීවිතයෙන් අප හැම පෝෂණය කරන ජේසු සමිඳාණෝ, ඒ ශක්තිය තුළ අප එකිනෙකාගේ ආත්මාර්ථයට මැරෙන්නටද ඒ මරණය තුළ උත්ථානයක් අත්දකින්නටද ඇරයුම් කරන සේක.

ස්වාමින්වහන්සේගේ දුක්ප්‍රාප්තිය හා මරණය ගැන භාවනා කරමින් ගැයෙන පසන් හා ලතෝනි ගායනා කරනු ලැබේ. මෙදින ගොඩමස් වැළකීමේ හා එක්වරු ශීල රැකීමේ දිනයකි. ගොඩමස් වැළකීම අවුරුදු 7 ඉක්මවූ හැමටද, එක්වරු ශීලය අවුරුදු 18-60 අතර වූ රෝගී හා ගර්භිණී අය හැර අන් සැමටද නියම වේ.

## ආලේලූයා සෙනසුරාදා

මෙදින ශුද්ධවූ සභා තොමෝ, සමිඳුන්ගේ සොහොන ළඟ සිටින්නීය. උන්වහන්සේගේ මරණය හා දුක්ප්‍රාප්තිය ගැන භාවනා කරමින් සමිඳාණන්ගේ විජයග්‍රාහී උත්ථානයට සූදානම් වීමට ශුද්ධ වූ සභා මාතාව සිය සැදැහැවතුන් සූදානම් කරනු ලබයි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කරනු ලබන්නේ මරණාසන්න වූවන්ට පමණකි.

මෙදින රාත්‍රියෙහිදී පැවැත්වෙන ස්වාමීන්වහන්සේගේ උත්ථානය සමරන පාස්කු පූර්ව රාත්‍රි මෙහෙයෙදී ප්‍රීති ජනක වූ උත්ථාන සමය ආරම්භ වන්නේය.

## පාස්කු පූර්ව රාත්‍රී මෙහෙය

පාස්කු පූර්ව රාත්‍රි මෙහෙය කොටස් හතරකින් සෑදී ඇත.

**(අ) පළමු කොටස :- ආලෝකයේ මෙහෙය.**

අලුත් ගින්දර අවුළුවා පාස්කු ඉටිපහන දල්වනු ලැබේ. පාස්කු ඉටිපහන උත්ථානවූ ක්‍රිස්තුස් වහන්සේ සංකේතවත් කරයි. මේ පාස්කු ඉටිපහන උත්ථාන සමය තුළ දේවස්ථානයේ දල්වනු ලැබේ. මේ පහන ප්‍රසාද ස්නාපන පිළිවෙතේදී දල්වමින් අපි ක්‍රිස්තු සමිඳුන්ගේ උත්ථානයට ප්‍රසාද ස්නාපනීය සක්‍රමේන්තුව තුළ සහභාගී වන අතර අවමංගල්‍ය පිළිවෙතේදී ද පාස්කු ඉටිපහන දල්වමින් කිතු සමිඳුන්ගේ උත්ථානය තුළ නව ජීවනයක් ලැබීමේ බලාපොරොත්තුව ඇති කරගන්නා බවද සංකේතවත් කරයි.

- පාස්කු ඉටි පහනද පිරිසිදු මී ඉටිවලින් තනනු ලැබේ. ඒ ඉටි පහනේ ක්‍රිස්තුස් වහන්සේ ඊයෙත් අදත් ආරම්භය හා අවසානය බව පවසමින් කුරුසියේ ලකුණු අඳිනු ලබයි.
- උන්වහන්සේ ආරම්භයත් අවසානයත් වන

බව දක්වමින් A (අල්ෆා) හා Ω (ඔමේගා) යන ග්‍රීක භාෂාවේ මුල හා අග අක්ෂර සලකුණු කරයි.

■ උන්වහන්සේට කාලයත් යුගයත් (2), අනන්ත කාලයත් (0) අයිති බවද, හැම යුගයෙහිම (2) මහිමය හා ආධිපත්‍යය අත්වේවා. (1) යයිද කියමින් කුරුසියේ හරස් කඩෙන් සෑදෙන කොන් සතරේ 2021 ද සලකුණු කරයි.



■ සලකුණු කරන ලද කුරුසියෙහි සුවඳ ලාටුවලින් සෑදූ ඇණ පහක් සවිකරමින් ස්වාමීන්වහන්සේ තමන් වහන්සේගේ ප්‍රභාවත් සිරි වන කැළැල් මගින් අප කෙරෙහි දක්වූ ආරක්ෂාව හා සුරැකියාව පෙන්නුම් කරයි.

■ අපගේ ආලෝකය ක්‍රිස්තුස් වහන්සේය යයි තුන්වරක් ගායනා කරමින් අඳුරේ ඇති දේවස්ථානය වෙතට දල්වන ලද ඉටිපහන ගෙන ආ පසු පාස්කු ජය මංගල ගීය මහත් ගම්භීරව ගායනා කරනු ලැබේ. සියලුදෙන දල්වන ලද ඉටිපහන් රැගෙන ඒ ගම්භීර ප්‍රකාශනයට තමන් ද හවුල් වන බව පෙන්නුම් කරති. පාස්කු ඉටිපහන ගම්භීරව දේවස්ථානයට ගෙන ආ පසු නියමිත තැන ස්ථානගත කරයි.

**(ආ) දෙවන කොටස :- දේව වාක්‍යයේ මෙහෙය.**

■ සභාවේ රාත්‍රි මෙහෙය අතර මුල්තැන ගන්නා මේ පූර්ව රාත්‍රි මෙහෙයේ සාම්ප්‍රදායිකව දේව වාක්‍ය පාඨ 9 ක් එනම් පැරණි ගිවිසුමෙන් පාඨ 7 ක් හා නව ගිවිසුමෙන් සන්දේශය හා සුවිශේෂය කියනු ලැබේ. සාන්ත සභාව සමිඳාණන් වහන්සේ ආරම්භයේ සිටම සිය සෙනග සඳහා සිදුකළ මහත් ආශ්චර්ය මේ දේව ප්‍රකාශන තුළ මෙනෙහි කරමින් උන්වහන්සේ අපට දුන් පොරොන්දු අරඹයා විශ්වාසය හා බලාපොරොත්තුව තිරසාර කරගන්නට මග පෙන්වන්නීය.

■ පැරණි ගිවිසුමේ පාඨ කියවා පිළිතුරු ගී ගායනා කළ පසු පූජාසනයේ ඉටිපහන් දල්වා මහත් ගම්භීරව ''සුරදූත ගීය'' හෙවත් ග්ලෝරියා ගායනා කෙරේ. දේවස්ථානයේ සීනුවද නාද කෙරේ.

■ ඉන් පසු පොදු යැදුමද සන්දේශයද ප්‍රකාශ කර මහත් ගම්භීරව ආලේලූයියා ගායනා කරනු ලැබේ. සැදැහැවතුන්ද ඒ ජයගොසට හවුල් වෙමින් ආලේලූයියා ගායනා කරති. ඉන්පසුව සුවිශේෂය ප්‍රකාශ කරනු ලැබේ.

**(ඇ) තෙවන කොටස :- ප්‍රසාද ස්නාපන මෙහෙය.**

පාස්කු ඉරුදින උදාවත්ම නවකයනට ප්‍රසාද ස්නාපනයේ නව උපත දීමේ අදහසින් මේ මෙහෙය පවත්වනු ලැබේ.

■ පළමුව කෙරෙනුයේ ප්‍රසාද ස්නාපන අපේක්ෂකයන් කැඳවීමයි. ඉන්පසුව සියලු සාන්තුවරයන්ගේ ප්‍රාර්ථනාව ගායනා කරනු ලැබේ. ප්‍රසාද ස්නාපන අපේක්ෂකයෝ නොසිටින විට සහ ප්‍රසාද ස්නාපන ජලය ආසිරි නොකරන විට සියලු සාන්තුවර ප්‍රාර්ථනාව ගායනා නොකෙරේ. එහෙත් ප්‍රසාද ස්නාපන අපේක්ෂකයෝ නොසිටියත් ප්‍රසාද ස්නාපන ජලය ආසිරි ගන්වන විට සියලු සාන්තුවර ප්‍රාර්ථනාව ගායනා කරනු ඇත.

■ ප්‍රසාද ස්නාපන අපේක්ෂකයන් තමන්ගේ එකම ස්වාමියා ගැලවුම්කරුවාණන් හා පරිශුද්ධ කරන්නා ලෙස පිතා, පුත්‍රයා, ස්ප්‍රීතු සාන්තු වහන්සේලා පිළිගන්නා අතර, යක්ෂයාද, පාපයද ප්‍රතික්ෂේප කරමින් තම විශ්වාසය එඩිතරව ඉටිපහන් දල්වා ප්‍රකාශ කරති. වැඩිහිටි නවකයෝ සිටිත්නම් සෙසු සැදැහැවතුන් විශ්වාසය ප්‍රකාශකරනු ලබන්නට පෙර ඔවුනට ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය දානය කරනු ලැබේ. අනතුරුව සියලු සැදැහැවතුන් ඉටිපහන් දල්වා තම ප්‍රසාද ස්නාපන පොරොන්දු අළුත් කරති. පසුව පියතුමා ආසිරි ගැන්වූ ප්‍රසාද ස්නාපන ජලයෙන් සියලු විශ්වාසකයන්ව ආසිරි ගන්වන්නෝය.

**(ඈ) සතරවන කොටස :- ස්තෝත්‍ර යාගික මෙහෙය.**

සභාව සමිඳාණන් සිය මරණය හා උත්ථානය මගින් සිය සෙනග සඳහා සූදානම් කළ මංගල භෝජනය කරා මේ මෙහෙය තුළ ජනතාව කැඳවන්නීය. පඬුරු පෙරහැරෙන් මේ කොටස ඇරඹෙයි. මෙහෙය අවසානයේදී ජනතාවට ආචාර කරන පූජාප්‍රසාදීතුමා යන්න සාමය ගෙන යන්න අලේලූයියා අලේලූයියා කියූ පසු ජනතාවද දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා අලේලූයියා ආලේලූයියා යයි කියමින් ආචාර කරති.

25 වන පිටුවට.....

ජූඩ් රවීන්ද්‍ර විනයසිරි
ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

# ලෝකෝත්තරයියක් වූ...... තලෙන්තු

දෙවි පියාණන් වහන්සේ අපට දී ඇති තලෙන්තු විවිධාකාරය. බොහෝ දෙන ඒ තලෙන්තු උපයාගනිමින්ද, ඔපමට්ටම් කර ගනිමින් ද සිටිති. සැබවින්ම අප එකිනෙකා සතු හැකියාවලට නිසි වටිනාකමක් හෝ අගය කිරීමක් ලැබෙනවා ද? නැතහොත් ඒ දක්ෂතා හෝ ප්‍රතිභාශක්ති සූරාකෑමකට ලක් වෙලා ද? විශේෂයෙන් කලාශිල්ප හා හැකියාවලට අන්තර්ජාලය, යූටියුබ් මාදිලිය, විද්‍යුත් ටීවී නාලිකා, එෆ්එම් නාලිකා හරහා ලබාදෙන්නේ නිසි අගය කිරීමක් ද, වටිනාකමක්ද?

මගේ හිතවතකු, ඔහු ඉතා දක්ෂ රංගන, ගායන, නර්තන ශිල්පියෙකි. ඔහු ජනප්‍රිය කාලේ ටෙලිනාට්‍යවල රඟපෑ කාලේ ඔහුට හොඳ ඉල්ලුමක් තිබුණා. ඒ නිසාම විද්‍යුත් නාලිකාවල විවිධ වැඩසටහන්වලට සහභාගි වන්නට ඔහුට ආරාධනා ලැබුණා. කොළඹින් දුර බැහැර සිටි ඔහු බස් රථයේම පැමිණ ඒ වැඩසටහන්වලට දායක වුණා. එහෙත් ඒ සහභාගිත්වය වෙනුවෙන් කිසිදු ගෙවීමක් සිදුවන්නේ නෑ. ටීවී නාලිකාවල හෝ එෆ් එම් නාලිකාවල වැඩසටහන්වලට සහභාගී වූවාට, ගුවන් කාලය පුරවනවාට කිසිදු මුදලක් දීමට තරම් තවම අපේ සමහර නාලිකා කාරුණික වෙලා නෑ. ඔබ සතුටින් නරඹන සති අන්ත සංගීතමය සාකච්ඡා වැඩසටහන් සිහියට ගන්න. සමහර නාලිකාවලින් ඒ සහභාගීවන කලා ශිල්පීන්ට කිසිදු ගෙවීමක් නොකෙරෙන ගානයි. සමහර නාලිකා පුංචිම තෑගි මල්ලකින් හෝ සොච්චං ප්‍රවාහණ ගාස්තුවකින් පමණක් ශිල්පීන්ව සනසනවා. සමහරවිට වාද්‍ය වෘන්දයට හා ශබ්ද පරිපාලනයට ගෙවීමක් කෙරෙනවා වෙන්ට පුළුවන්. එපමණයි. සමහරක් වැඩසටහන් අනුග්‍රාහක භවතුන් විසින් පාලනය වන ඒවා. ඒ වගේම වැඩසටහන අතරතුර වෙළඳ දැන්වීම් කොතරම් ප්‍රමාණයක් ප්‍රචාරය වෙනවා ද, එහෙත් ශිල්පීන්ට ගෙදර යන්ට වෙන්නේ බොහෝ විට හිස් අතින්.

අර මා කලින් සඳහන් කළ රංගන ශිල්පියා අද ආබාධිතයි. ඒ නිසාම ඔහු රංගනයෙන් තරමක් ඈත්වෙලා. මිතුරන්ට ඕන වුණා ඔහුව කිසියම් රූපවාහිනී නාලිකාවක වැඩසටහනකට සහභාගි කරවන්නට, රසික මතකය යළිත් අවුස්සන්නට. අදාළ ටීවී නාලිකා වෙන් අවසරය ලැබුණා. ඒත් ප්‍රවාහණ පහසුකමක් දෙන්න තරම් ඒ නාලිකාව කාරුණික වූයේ නෑ. මිතුරන් පිරිසක්ම එකතුවෙලා කොළඹින් බැහැර සිට ඔහුට ප්‍රවාහණ පහසුකම් සැපයුවා. ඒ ශිල්පියා වැඩ සටහනට සහභාගී වුණා. හොඳින් සිටි කාලයේ තමන්ගේ නාලිකාවලට නොමිලේම දායකත්වය ලබාදුන් ශිල්පියෙකුට අමාරු කාලයක දී උදවු කරන්නට බැරිතරම් අකාරුණික වූ විද්‍යුත් මාධ්‍ය ඇති රටක් මේක.

**මතු සම්බන්ධයි...**

**රොඩ්නි වර්ණකුල**
බෝපිටිය

## පොරොන්දු විජිතයේ හිමිකම් ලද්දෙමු.

පොරොන්දු විජිතයේ හිමිකම් ලබන්නට
මිනිසා වැටී සිටි පාපෙන් මුදන්නට
දේව පියා අප හට ඇති දයාවට
දේව පුතා ජේසුව එව්වා අපට

පිළිසිඳ ගැනීමෙදි උත්පත්තිය දැරුව
ජීවිත ගමන දුක සැප දෙකටම හුරුව
දෙව් අණ අනුව දෙව්පිය හට කීකරුව
කුරුසිය කරට ගත්තේ ඉවසනු බැරුව

වද වේදනාවෙන් කුරුසේ වද වින්ද
මේ දුක මිනිසෙකුට ඉවසනු පුළුවන්ද
කුරුසේ ඇණ ගසා ඇල ඉලකටු බින්ද
ජේසුනි මෙලෙස වීමට හේතුව මන්ද

දෙව් අණ අනුව ඉටු කරනට පොරොන්දුව
ඔබ කැප කළේ දෙවියන් වෙත උනන්දුව
දෙපයට දමා තිබූ පව් බර විලංගුව
අවසන් කළා පාපෙට තිබූ වලංගුව

මුළු විජිතයට සදා සාමය ගෙන ආව
ජේසුනි ඔබයි පාපෙන් ගැලවූයේ මාව
දෙව්මව් සමඟ ජේසුගෙ පාමුල ගාව
නමදිමු පුදමු බැතියෙන් ඔබෙ කරුණාව

ජේසුනි දෙව්මවුනි අප හට වෙන්න සමා
අප දුක් විඳින්නේ අපෙ පව්වලට තමා
ඉසිකෝ මද මාන පැවතුම් ඉවත දමා
පොරොන්දු විජිතයේ හිමිකම් ලබමු සැමා

**බෙනඩික් විජේසිංහ**
කඩවත

# පාස්කුව සහ සිංහල/දෙමළ අලුත් අවුරුද්ද



ජාති ආගම් කුල මල ඈ කිසිවක් නොතකා ශ්‍රී ලාංකික ජනතාව එක මවකගේ දරු කැලක් ලෙසට පෙබරවාරි 4 වන දා අපි අපේ රටේ 73 වන නිදහස් දිනය පැවැත්වූයෙමු. ඊට අමතරව වසරක් පාසා ශ්‍රී ලංකා වාසි බහුතරයක් දෙනාට ආගම් භේද, බාල මහලු, ස්ත්‍රී - පුරුෂ, ඇති හැකි - නැති බැරි හැමෝම එක්ව සතියක් පුරා උත්සව පැවැත්විය හැකි, සතුටු විය හැකි සමයක් ළං ළංව පැමිණෙයි. එය නම් සිංහල/දෙමළ හින්දු අවුරුදු සමය සහ පාස්කු සමයයි.

2019 පාස්කු ඉරිදා ප්‍රහාරය නිසාත් 2020 කොරෝනා නිසාත් අවහිර වූ ඒ සතුටු සමය මේ වසරේදීත් ඉදිරි වසර ගණනාවක්ටත් අපට භුක්ති විඳිය හැකි වනු ඇතෙයි සිතමු. ඒ සඳහා වෙහෙසෙමු, යදිමු. සිංහල/දෙමළ අවුරුද්දට දින නියම කෙරෙන්නේත් ඒ හා අනුබද්ධ චාරිත්‍ර වාරිත්‍ර සඳහා නැකත් හදන්නේත් ලංකාවේ ම ජ්‍යොති ශාස්ත්‍රවේදීන් විසින් වුවද ලෝකවාසී සියල්ලන්ටම පාස්කු දිනය තීරණය කරනු ලබන්නේ ශතවර්ෂ 33 කට පෙර සිට කෙරෙන ක්‍රමයකට අනුවය. එනම් ජුදා ජනතාවගේ ඉපැරණි ලිත් ක්‍රමයකට අනුවය. ඔවුන්ගේ ලිත චන්ද්‍ර මාස ක්‍රමය අනුව සැදුණකි. ඔවුන්ගේ පළමු මාසය වූයේ නිසාන් මාසය ය. එය ඇරඹෙන්නේ සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට ඇතුළු වූ පසු (මාර්තු 21 න් පසු) පායන ප්‍රථම නව සඳ බැලීමත් සමගය. එතනින් පටන් ගන්නා නිසාන් මාසයේ පසළොස්වක දා ට එනම් 14 දාට පාස්කු දිනය සැමරීම දේව නියෝගයක් විය (නික්මයාම 12:1-28). ඊශ්‍රායල් ජනතාව මිසරයේ පාරාවෝ රජුගේ වහලුන් මෙන් නොයෙකුත් තාඩන පීඩනවලට හිර වී සිටියදී දෙවියන් වහන්සේ ඔවුන් බේරා ගෙන රතු මුහුද මැදින් එගොඩ කරගෙන පොරොන්දු දේශය කරා ගෙන ගිය අයුරු උපන් නූපන් මතු පරම්පරාවලට වසරක් පාසා මතක් කර දීම පිණිස පනවන ලද මංගල්‍ය පාස්කුව හෙවත් පෙසඃ (හෙබ්‍රව් භාෂාවෙන්) යනුවෙන් හැඳින්විණ. සැම වසරකම නිසාන් මස 10 වන දාට වසරක් පිරුණ, කිසි කැළලක් නැති, අංගෝපාංග අඩුවක් හෝ තුවාලයක් හෝ නැති නීරෝග පිරිමි බැටළු පැටවකු තෝරා වෙන් කර තබා ගත යුතු විය. 14 වනදා මළ හිරු එළියෙන් ඒ අහිංසක සතා මරා ඒ ලේ උළුවස්සේ තවරා නිවැසියන් සමග එදින රාත්‍රියේම අනුභව කළ යුතු විය. අනුභව කිරීමට නොහැකිව යමක් ඉතිරි වී නම් එය එළිවන්නට පෙර පුළුස්සා දැමිය යුතුය.

ජේසුස් වහන්සේ එම සම්ප්‍රදායට අනුව සිය ගෝලයන් සමග ජෙරුසලමේ සුවිසල් උඩු මහල් කාමරයකට නැග වාඩිවූයේ ඒ සම්ප්‍රදාය අනුව පාස්කු භෝජනය වැළඳීමටය. මරණ තර්ජන හා ගර්ජන කොතෙකුත් තිබියදීත් (ජුවාම්7:7-13) උන්වහන්සේ මෙහි පැමිණියේ ඉතා ආසාවකින් හා උනන්දුවකින් බව අසුන්ගත් සැණින්ම කියා ඇත (ලූක් 22:15). ඒ අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේදී, උන්වහන්සේ අහිංසක බැටළු පැටවකු පාප විමෝචනය සඳහා මරනවා වෙනුවට තමන්වම පූජා කිරීමට අදිටන් කරගෙන, තමන්ව පාවා දෙන්නට සිටි ජුදාස් ද ඇතුළු සිය ගෝලයන්ගේ පාද සෝදා ඔවුන් පිටස්තරයට වඩා ඇතුළාන්තයෙන්ම පිරිසිදු කර (ජුවාම් 13:4-11) තමන් සමග එකට වාඩි කරවා පුරාණ ගිවිසුම නව ගිවිසුමකට වැඩි දියුණු කිරීමට පියවර ගත් සේක. බැටළු මස් වෙනුවට උන්වහන්සේ රොටී ගෙන " මේ මාගේ ශරීරයයි,මෙය රැගෙන කන්න"යි කියාද, උළුවස්සේ තවරන බැටළු ලේ වෙනුවට ආදේශකයක් වශයෙන් සදහටම ලොව පුරා වගුරවනු ලබන සිය රුහිරයට, පෙර නිමිත්තක් ලෙස උන්වහන්සේ මිදිරස පිරුණ පාත්‍රයක් සියතට ගෙන "මෙය වනාහි බොහෝ දෙනකු උදෙසා වගුරවනු ලබන මාගේ රුධිරයයි, මෙය රැගෙන බොන්නැ" යි (මාක් 14:22-25) කියාද නව පාස්කු පිළිවෙතක් ඇරඹීය.

එසේ ඇරඹුණු ඒ ක්‍රියාදාමය කූටප්‍රාප්තියට පාත්‍ර වූයේ මහ සිකුරාදා කුරුස ගසේ යාග වීමත් ඉන් අනතුරුව මහා සබත් දිනය වූ සෙනසුරාදා හා (එනම් සිකුරාදා හිරු බැස ගිය තැන් සිට සෙනසුරාදා හිරු බැස යන තෙක්) සොහොන් ගැබේ

25 වන පිටුවට.....

ගරු ඩී. එෆ්. මැදගොඩ පියතුමා
මාරවිල.

# ඕං එහෙනං



තවමත් කොරෝන එය නවතින්නෑ වැඩි වැඩියෙන් එය පැතිරෙන්නා
ඒ හුටපටයෙන් වසරක් ගෙවිනා පුබුදන සඟරුව නැවතුනෙනා
පාස්කු අවුරුදු නත්තල් සියල්ල නිවස තුළට සීමා කෙරුනා
මේ වසරේවත් පාස්කු අවුරුදු සමරනු හැකිවේ යැයි සිතෙනා

පාස්කු අවුරුදු අත ලඟ එනවා කොරෝන යකාද සැරිසරනා
මුඛවාඩම් බැඳ මීටරෙ පරතරෙ තියාන සියල්ල යුතුවෙන්නා
නඩයක් අරගෙන ඩෙඟා නට නටා පාස්කු සවාරි පවතින්නා
මනස්තාප වී කළ පව් සිහිකර පපුව පලන්නට සිදුවන්නා

පාස්කු කියන්නෙ එතෙර වීම නම් සිත් වෙනසක් වියයුතු වන්නා
පාදනමස්කාරෙයි, කයදුෂ්කාරෙයි තුන්පැය දැහැනත් සැමරෙන්නා
සිත් වෙනසක් නැත තෙතමනයක් නැත සෝයුරු ප්‍රේමය නොතකන්නා
සුදුහුණු ගාගෙන සොහොන් කොත් වගේ සුදට සුදේ උන් දිලිසෙන්නා

ගස් ටික කැපුනා වැලිගොඩ දැමුනා කුණුගොඩ කන්නට අලි එන්නා
ගංදිය ගැලුවා කඳුවැටි වැටුනා මුළු පරිසරයම කිලිටි වුණා
අලි ගම් වැදුනා ජීවිත නැසුනා අලිවැට ඉල්ලා මොරදෙන්නා
බීරි අලින් හට වීණා වයමුද පාස්කු අවුරුදු සමරන්නේදැයි නොතේරෙනා

පල්ලිත් යනවා පන්සල් යනවා පිළිම ප්‍රතිමා ලඟ වැඳ වැටෙනා
බණත් අහනවා බයිබලෙ බලනා සිරිතට විරිතට වැඩ කෙරෙනා
දුක නොහඳුනනා, දයාව නොදන්න මිනිසුන් ජීවිත ගතකරනා
පාස්කු ආවත්, අවුරුදු ආවත් ජීවිත වෙනසක් නැත දකිනා

දියවන්නාවේ සුව කුමරියටත් කොරෝනා හැදිලා බියවන්නා
නිරෝධායනේ නිවාඩු ගන්නට ලොකු ලොකු හෝටල් වෙන්කෙරෙනා
හොඳ හොඳ කුක්කෝ රජගෙට යනකොට තෙමිච්ච කුක්කෝ බලු වෙන්නා
මේවා බල බල මුඛවාඩම් බැඳ මුහුදට පනින්ට සිත දෙන්නා

**සූරිය මාමා - ජෝසප් ඩයස්**

පාස්කුව සහ... 23 වන පිටුවෙන්.....

සිට සදහටම මුළු මිනිස් වර්ගයා සඳහාම මරණය පරාජය කර, සතියේ පළමු වන දා එනම් ඉරිදා හිමිදිරි උදයේ ලෙන්දොර පෙරළාගෙන උත්ථාන වීමෙන්ය (ජුවාම් 20:1-18). මෙයයි කිතුනුවන්ගේ පාස්කු මංගල්‍යය. මහා බ්‍රහස්පතින්දායින් පටන්ගෙන පාස්කු ඉරිදායින් සම්පූර්ණ වූ ඒ සිද්ධි දාමය මය, අපි සෑම දිව්‍ය පූජාවකි සිදු කරන්නේ. සිංහල/දෙමළ/හින්දු උත්සවය ඇරඹෙන්නේ ගෙවල් දොරවල් ගෙවත්තේ සිට මුළුතැන්ගේ දක්වා සියලුම දේ අලුත් කිරීමක් අප්‍රියල් 13 දක්වා එනම් පරණ අවුරුද්ද නිමවීමට පෙර සිදුකරන්නාක් මෙන් කිතුනුවන් ද අළු බදාදා සිට දින හතළිහක් වෙන්කර ඇත්තේ මේ සඳහා පිටස්තරයෙන්ද ඊටත් වඩා ඇතුළාන්තයෙන් ද සූදානම් වීම සඳහා ය. (චතාරිකයේ දින 40 ට ඉරුදිනවල් හා මහ බ්‍රහස්පතින්දාත් මහ සිකුරාදාත් අයිති වන්නේ නැත.) පරණ අවුරුදු චාරිත්‍ර වශයෙන් කළගෙඩි වල ඉතිරිව තිබුණ පරණ ජලය, පරණ ගිනි පෙනෙලි, ලිපේ අළු, පරණ තෙල් යනාදිය ඉවත දමන්නා සේ පරණ ආසිරි පැන්, පරණ ශුද්ධවූ තෛලය යනාදිය ඉවත් කෙරේ. පරණ නොහොඳ නෝක්කාඩුකම් යනාදිය ද ඒ සමග ඉවත දමා නව වසරට නව දිවියක් අරඹන්නට සිතට ගනී.

## නොනගතය

මහ සිකුරාදා රාත්‍රී 12 න් පසු එළඹෙන්නේ අපගේ නොනගත කාලය යි. සෙනසුරාදා දිවා කාලය නිහඬව, සංසුන්ව පුරාණ ගිවිසුමේ සබත අපි ගත කරමු. ඊළඟ දිනයේ සිට එනම් ඉරිදා සිට අපි නව ගිවිසුමේ සබත පවත්වමු. සිංහල අවුරුදු නොනගතයේදී ඇතැම් පැරැන්නන් කෙළවත් ගිලින්නේ නැතිව සිටියාක් මෙන් කතෝලික සභාවේත් අප කුඩා කල රාත්‍රී 12න් පසු කෙළ බිඳක්වත් නොගිල හිටියේ පසුදින පූජාවට ගොස් දිව්‍ය ආහාරය ලබාගැනීමට සූදානමක් වශයෙනි. වැඩිහිටියන්ට වැඳීමක් අපේ වත්පිළිවෙත්වලට නැත.තෑගිබෝග හුවමාරු කිරීමක් ගනුදෙනු කටයුතු ආදියත් පාස්කුවට නැත. අලුත් අවුරුද්දට ලිප ගිනි මොලවන්නාක් මෙන් පාස්කු ඉරිදාට පෙර රාත්‍රියේ දේවස්ථානය ඉදිරිපිට ගිනිමැලයක් ගසා නව ගින්දරකින් පාස්කු ඉටිපහන් දල්වා එම පහනින් සෑදැහැවතුන්ද තම තමන්ගේ ඉටි පහන් දල්වාගෙන අඳුර පහකළ අලුත් ආලෝකයේ වර්ණනාවට සවන්දෙති. රතු මුහුද මැදින් වහල් කමේ දේශය පසුකර නිදහස් නිවහල් ලොවකට පා තැබූ නියාව සිහිකරමින් නව ආසිරි පැන් ඉසිනු ලැබේ. බව්තිස්ම ලැබූ නවකයන් ශුද්ධවූ තෛලයෙන් ආලේප කරනු ලැබ සුදු වතින් සැරසී ඔවුන් සමග සියල්ලෝ බව්තිස්ම පොරොන්දුව අලුත් කරති. අලුත් ආහාර වශයෙන් දිව්‍ය සත්ප්‍රසාදය අනුභව කරති. මේ අයුරින් බලන කල සිංහල/දෙමළ අවුරුද්ද කිතුනු අපට ඉතා සමීප උත්සවයකි. නැකැත් වෙලාවල් නොතකා අනිකුත් සියල්ලට සහභාගිවීමට කිතුනුවන්ට පුළුවන. ඊට අනුබල දීමක් වශයෙන් 1980 දශකයේ අග හරියේදී අලුත් අවුරුදු පූජාවක්ද ඊට අදාළ ගීතිකා ද සූදානම් කළ බව මට මතකය. "ආලෝකයේ දරුවෝ වෙමු අපි" යන ගීය ඒ සඳහාම තැනූ බව ද මට මතකය.එහෙත් එම සිංහල අවුරුදු දිව්‍ය පූජාව කුමක් වී දැයි නොදනිමි.

ශුද්ධ වූ සතිය... 21 වන පිටුවෙන්.....

## පාස්කු ඉරුදින

මරණය පැරදූ ජේසු සමිඳාණන් මුළු ලොව මරණින් ගැලවීමේ මහා අභිරහස මෙදින මහත් උත්සවාකාරයෙන් සමරමු. දුක, වේදනාව, අසහනය, අසාධාරණය තුළ මිනිසා තැළූ පෙළූ පාපයේ වහල් බවින් ඔවුන්ව එතර කිරිමට ජේසු සමිඳාණන් ගත් කුරුසියේ විජයග්‍රාහී ගමන අපට හෙළි කළේ සත්‍ය අසත්‍ය වඩා බලවත් බවත් යහපත අයහපත අබිබවා යන, ප්‍රේමය වෛර කිරීමට වඩා උත්කෘෂ්ට වන, ජීවිතය මරණය පිටුදකින අයුරුය.

අපගේ ප්‍රසාද ස්නාපනීය ජීවිතය තුළ මේ උත්ථානයේ පාස්කු අභිරහසට අපවද ඇතුළු කරන සාන්ත සභා මාතාව හැම දිනම පාස්කුවක් එනම් ප්‍රසාද ස්නාපනීය ජීවිතයක් අත්දැකිය යුතු බවත් ඒ තුළ අසත්‍ය, අයහපත, වෛරය, මරණය පරදවා සත්‍යයේ, යහපතේ, ප්‍රේමයේ නව ජීවිතයක් ලබාග න්නට උනන්දු කරවයි. මෙනිසා මුලින්ම කී පරිදි පාස්කුව දේවවන්දනා වසරේ ප්‍රධානම මංගල්‍යය පමණක් නොව කිතුනු ඇදහිල්ලේ කේන්ද්‍රයයි. එනිසා අපගේ ජීවිතයේ හැම සිතුවිල්ලක්ම වචනයක් සහ ක්‍රියාවක් කේන්ද්‍රගත විය යුත්තේ පාස්කුව මුල්කරගෙනය. එනම් ආත්මාර්ථයට නැසී පරාර්ථයට නව ජීවනයක් ලැබීමටය.

# පුංචි විකුම්

# ළමා ප්‍රබෝධනය





## 'ONLINE' අභියෝගයක්ද?

කොවිඩ් වසංගතය නිසා 'භක්ති ප්‍රබෝධනය' සඟරාව පසුගිය කාලයේ මුද්‍රණය කිරීමට නොහැකි විය. මාස ගණනාවකට පසු එය නැවත මුද්‍රණය කිරීමට අදහස් කර ඒ වැඩකටයුතු ආරම්භ විය. මේ ඔබ අතට පත්වී ඇත්තේ මාර්තු/ අප්‍රේල් කලාපයයි. පසුගිය වසරේ පාස්කු අවුරුදු කාලය නිවෙස් තුළම පවත්වන්නට අප සැමට සිදුවූ අතර මේ වසරේ ද එය කෙලෙස පැවැත්වීමට සිදුවේදැයි සැක සහිතය.

ජන ජීවිතය අඩාල වුණි. පාසැල් වැසුණි. එහෙත් දැනට බස්නාහිර පලාත හැර සෙසු පලාත්වල පාසැල් විවෘත වී ඇත. එදිනෙදා කටයුතු සාමාන්‍ය අතට හැරෙමින් පවතී. එහෙත් කොවිඩ් වසංගතයේ නම් අඩුවක් දක්නට නැත. කොවිඩ් මර්දන එන්නතද දැන් දීම ආරම්භ කර ඇත.

කොවිඩ් වසංගත තත්ත්වය නිසා පාසැල් වසාදැමීමට සිදුවූ හෙයින් 'ඔන්ලියින්' ක්‍රමයට ඉගැන්වීමේ කටයුතු ඇරඹුණි. ඇති හැකි දරුවන් ඉන් උපරිම පල නෙලාගත් අතර නැතිබැරි දරුවන්ට සිදුවූයේ කබලෙන් ලිපට වැටීමකි.

උසස් පෙළ හදාරන දරිද්‍රතාවෙන් පෙළුණ ගාල්ල ප්‍රදේශයේ ජීවත් වූ මුස්ලිම් ජාතික 'ෂුක්රා' දියණිය, 'සිරස' නාලිකාවේ 'ලක්ෂපති' තරඟයට ඉදිරිපත් වූයේද 'ලැප්ටොප්' එකක් මිලදී ගන්නට නොහැකි වූ නිසාය. එහෙත් ඇය මිලියන දෙකක් සමඟ 'ලැප්ටොප්' කිහිපයක්ම දිනාගන්නට සමත් වූවාය. ඒ ජයග්‍රහණය සමරන්නට ඇයගේ විදුහලේ පැවති උත්සවයකදී ඇය පැවසුවේ එක 'ලැප්ටොප්' එකක් තමන්ට තියාගෙන අනිත් ඒවා තමන් වැනි වූ වෙනත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බෙදා දෙන බවය.


එක්තරා ගමක් උසස් පෙළ විභාගයට පෙනී සිටි දරු දැරියන් දොළොස්දෙනකු පමණ එක්රැස් කරගෙන කුඩා සංවිධානයක් පිහිටුවා ගත්තේ 'දිලීප' දරුවාගේ මූලිකත්වයෙනි. ඔවුන්ගේ අරමුණ වූයේ, 'ඔන්ලයින්' ක්‍රමයට ඉගෙනීමට පහසුකම් නොමැති සහෝදර දරු දැරියන් සඳහා පන්ති පැවැත්වීමය. පන්සලේ හාමුදුරුවන්ගේ හා පල්ලියේ පියතුමන්ගේ සහාය ඔවුන්ට ලැබුණි. පන්සලේ බණමඩුවත් පල්ලියේ මීසම් ශාලාවත් ඒ සඳහා ඔවුන්ට ලැබුණි. සෞඛ්‍ය පරීක්ෂක තුමාගේද අනුමතිය ලබාගත් ඔවුහු සෞඛ්‍ය නීතිරීතිවලට අනුකූලව ළමයින් පණහකට පමණ පන්ති ආරම්භ කළහ. සියලු විෂයවලට සිසුන් ඒ සඳහා සහභාගී වූ අතර සාර්ථකව පන්ති පැවැත්වීම පිළිබඳව ගම් වාසී හැමගේ ප්‍රසාදය ඔවුන්ට හිමිවිය. ගමේ ගුරුවර ගුරුවරියන්ගේත් සහායද නොමඳව ඔවුන්ට ලැබුණි. පන්සලේ හාමුදුරුවෝද පල්ලියේ පියතුමාද ඔවුන්ගේ සත්ක්‍රියාව අගය කළහ.

ආදර දුවේ පුතේ, ඒ අයියලා අක්කලා මුළු රටටම පෙන්වූ ඒ මහඟු ආදර්ශය අපි අගය කරමු. මේ පාස්කු සමයේ එවැනි සැබෑ සිත් වෙනසක් ඇතිකරගෙන යහපත් සිතිවිලි පුබුදුවා ගන්නට වෑර දරමු.

ඔබ සැමට සුබ පාස්කු මංගල්‍යයක් සහ මල්බර අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමි.

**සූරිය මාමා**

## ප්‍රහේලිකා අංක - 62



### හරහට

1. 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ වැඩිපුර කතාබහට ලක්වූ මාතෘකාව.
5. ඇමරිකාවේ සහ ඇෆ්ගනිස්ථානයේ තලේබාන් සංවිධානය අතර සාම ගිවිසුම අත්සන් කළේ මේ නගරයේදීය.
6. අභාවප්‍රාප්ත ටෙනිසන් කුරේ රංගවේදියාණන් සිනමා දිවිය ආරම්භ කළ සිංහල චිත්‍රපටිය.
10. "mol" යන සම්මත මිනුම් ඒකකයෙන් හඳුන්වනු ලබන්නේ.
11. "සයරේ" රාජ්‍යය අතීතයේ හැඳින්වූ නාමය.
13. වේගයට සමාන අරුත් දේ.
14. අතීතයේ "ආළිසාර ඇළ" ලෙස හැඳින්වූ ඇළ.
16. ජනතාව මෙන්ම ධනයට සමාන වචනයකි.
17. "මාලය" යන්නට සමාන වචනයකි.
19. කාන්තා ඇඳුමකි.
20. දිව්‍ය ලෝකයේ වීණා වාදකයා.
22. ග්‍රීසියේ අගනුවර.
24. දිග මනින මිනුම් ඒකකයකි.
25. අන්තර්ජාතික තරගවලදී ගෝල 100 ක් ලබාගත් පළමු යුරෝපීය පාපන්දු ක්‍රීඩකයා.

### පහළට

2. ලෝකයේ කුඩාම රාජ්‍යය.
3. "...........යි දාගැබයි, ගමයි පන්සලයි"
4. "නගුල" නමින් හඳුන්වන තරු රටාව.
7. "රස අංජනය" මෙලෙස සන්ධි වේ.
8. කලා වැවේ සිට තිසා වැවට වතුර ගෙන යන ඇළ.
9. උපසම්පදා ලැබීමට පෙර භික්ෂූන් වහන්සේලා මේ නමින් හැඳින්වේ.
12. ශු. ජුසේවාස් මුනිතුමා උපන් ප්‍රදේශය.
14. ලෝකයේ විශාලතම වනාන්තරය.
15. දේශීය ආහාරයකි.
16. අවිනිශ්චිත අයහපත් දේ සිදුවන විට මෙය හොඳ නැතැයි සමහරු කියයි.
18. "ගොරෝසු" යන්නට සම අරුත් දේ.
21. ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ නෙස්ටෝරියානු වාදයට විරුද්ධව දේව මාතෘත්වය පිළිබඳව කතා කළ ශුද්ධවන්තයෙකි.
22. ශරීරයට සමාන වචනයකි.
23. ධාන්‍ය වර්ගයකි.

සැකසුම :

**ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා**
මීසම් සේවක, ඇඹිලිපිටිය.

## ප්‍රහේලිකා අංක 60 ජයග්‍රාහකයෝ

- **පළමුවන ස්ථානය** - ඉයේෂ් පෙරේරා
11 වසර, සා. පීතර විද්‍යාලය - ගම්පහ.
- **දෙවන ස්ථානය** - ඕනාර ඩිහේන් බොතේජු
5 වසර, ශ්‍රී රතන ජෝති ප්‍රාථමික විදුහල, යෝගියාන.
- **තෙවන ස්ථානය** - යොලන්ඩා පෙරේරා/ ටෙරෙන්සියා දල්පතාදු
10 වසර, ආවේ මරියා කන්‍යාරාමය, මීගමුව.

ඔබගේ පිළිතුර තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, **2021 මාර්තු 31** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්,** රු.1000.00, රු. 750.00, රු. 500.00 බැගින් පිරිනැමේ.

**විශේෂ මතක් කිරීමක්** - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.

**ප්‍රහේලිකා අංක - 62**
**"ළමා ප්‍රබෝධනය",**
**අංක 265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**

**කතෝලික ධර්මය**
**අ.පො.ස. (සා./පෙළ) විභාගය - 2021**
**ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I කොටස**

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පුරාණ ගිවිසුම තුළ දේව අනාවරණය ප්‍රබලව ප්‍රකාශ වූ ගිවිසුම කුමක් ද?
   (i) ආදම් සහ ඒව සමඟ ඇති කර ගත් ගිවිසුම
   (ii) නෝවා සමඟ ඇතිකර ගත් ගිවිසුම
   (iii) මෝසෙස් සමඟ ඇති කර ගත් ගිවිසුම
   (iv) ආබ්‍රහම් සමඟ ඇති කර ගත් ගිවිසුම

02. පුරාණ ගිවිසුමේ මුලින්ම සඳහන් කරනු ලබන පූජකයාගේ නම කුමක් ද?
   (i) ජාකොබ් (ii) ආබ්‍රහම් (iii) මෝසෙස් (iv) මෙල්කිසදෙත්

03. ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසට සම්බන්ධ වීමෙන් අප ලබන භාග්‍යවන්ත බව නම්,
   (i) ස්වර්ගීය සැපත කරා අප ගෙනයාමයි
   (ii) ජීවිත කරදර අවමවීමයි
   (iii) මෙලොවෙහි අප ජීවත් කරවීමයි
   (iv) ජීවිතය පහසුවෙන් ගත කිරීමයි

04. දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට දායාද කරන ලද සම්ප්‍රදාය කුමක්ද?
   (i) ලිඛිත (ii) වාචික (iii) යාවේ (iv) පූජක

05. නව ගිවිසුමේ සංකේත භාවිතයෙන් ලියා ඇති ග්‍රන්ථය කුමක්ද?
   (i) සන්දේශ (ii) එළිදරව්ව (iii) ලූක් සුබාරංචිය (iv) ක්‍රියාපොත

06. එළිදරව්ව සාහිත්‍යයෙහි එන කළු වර්ණයෙන් අර්ථවත් කරනුයේ.
   (i) මරණයයි (ii) යුද්ධයයි (iii) ජයග්‍රහණයයි (iv) සාගතයයි

07. ශුද්ධ බයිබලය එක් පොතක් නොව පොත් සමූහයකින් සමන්විත නිසා එය,
   (i) ශබ්දකෝෂයකි (ii) පුස්තකාලයකි (iii) විශ්වකෝෂයකි (iv) විවරණයකි

08. ගිබියොන්හි ප්‍රධාන කඳු මත පූජාස්ථානයට පූජා ඔප්පුකිරීම පිණිස ගියේ (1 රාජාවලිය 3:4 ශු. බයිබලය නව අනුවාදය 2006),
   (i) සලමොන් රජතුමා ය (ii) දාවිත් රජතුමා ය
   (iii) හෙරෝද් රජතුමා ය (iv) පිලාත් රජතුමා ය

09. කතෝලික ධර්මය පදනම් වී ඇත්තේ,
   (i) සභා සම්ප්‍රදාය මතය (ii) ශුද්ධවූ සභාව මතය
   (iii) දේව වචනය (iv) අපෝස්තලික සම්ප්‍රදාය මතය

10. ජේසුස් වහන්සේගේ කරපිට තැබූ කුරුසිය උසුලාගෙන යාමට සහාය වූයේ
   (i) නිකදේමුස් ය (ii) රෝම සොල්දාදුවන් ය
   (iii) පේදුරු තුමා ය (iv) සීරේනියේ සීමොන් ය

11. දෙවියන් පිළිබඳ පරම්පරා ගත විශ්වාසය හා අත්දැකීම් පදනම් කරගෙන ශුද්ධ බයිබලයේ ලියැවී ඇති කාණ්ඩය වනුයේ,

(i) දිවැසි පොත් ය (ii) ඉතිහාස පොත් ය (iii) පංච පුස්තකය (iv) ප්‍රඥා පොත් ය

12. පහත සඳහන් ග්‍රන්ථ අතුරෙන් පැරණි ගිවිසුමේ ඇති ද්වීතීය ග්‍රන්ථය කුමක්ද?

(i) හොසියා (ii) රූත් (iii) තෝබිත් (iv) විලාප ගී

13. ජේසුස් වහන්සේගේ වංශාවලියෙන් තම සුවිශේෂය ආරම්භ කරන්නේ,

(i) ශුද්ධ වු මාක් තුමා (ii) ශුද්ධ වු මතෙව් තුමා

(iii) ශුද්ධ වු ජොහාන් තුමා (iv) ශුද්ධ වු ලූක් තුමා

14. නෝවාගේ ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ,

(i) කෙරුබ් වරු (ii) දේදුන්න (iii) දස පනත (iv) චර්මච්ඡේදනය

15. පංච පුස්තකය රචනාවීම සඳහා දායක වී ඇති ප්‍රධාන දේව ධාර්මික සම්ප්‍රදාය ගණන,

(i) එකකි (ii) දෙකකි (iii) තුනකි (iv) හතරකි

16. ශුද්ධ වු පේදුරු තුමාගේ භාෂා පරිවර්තකයා වූයේ

(i) ශුද්ධ වූ ලූක්තුමා ය (ii) ශුද්ධ වු ජොහාන්තුමා ය

(iii) ශුද්ධ වු මතෙව්තුමා ය (iv) ශුද්ධ වු මාර්ක්තුමා ය

17. ජේසුස් වහන්සේගේ උත්ථානයේ ප්‍රථම සාක්ෂිකාරිය වූයේ කවුරුන් ද?

(i) මග්දලාවේ මරියා (ii) මරියා (iii) වෙරෝනිකා (iv) එලිසබෙත් තුමිය

18. ජේසුස් වහන්සේ ජුදයන් අතට පාවා දීමෙන් අනතුරුව රැගෙන ගියේ කොහේටද?

(i) ගෙත්සෙමනි උයනට (ii) උත්තම පූජකයාගේ මැඳුරට

(iii) කපාලකන්දට (iv) ගොල්ගොතාවට

19. ගිනි අඟුරකින් තොල් පවිත්‍ර කළ දිවැසිවරයා වන්නේ,

(i) හොසියා ය (ii) නාතාක් ය (iii) යෙසායා ය (iv) ජෙරමියා ය

20. මැවීම පිළිබඳ දෙවන කතාව කිනම් සම්ප්‍රදායට අයත් වේද?

(i) එලොහිම් සම්ප්‍රදාය ට (ii) පූජක සම්පදාය ට

(iii) ද්වීතීය නීති සම්ප්‍රදාය ට (iv) යාවේ සම්ප්‍රදාය ට

## පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | (iii) | 05. | (ii) | 09. | (iii) | 13. | (ii) | 17. | (i) |
| 02. | (iv) | 06. | (iv) | 10. | (iv) | 14. | (ii) | 18. | (ii) |
| 03. | (i) | 07. | (ii) | 11. | (iii) | 15. | (iv) | 19. | (iii) |
| 04. | (ii) | 08. | (i) | 12. | (iii) | 16. | (iv) | 20. | (iv) |

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
ආචාරිනී - මිනු/ ශ්‍රී ඥානෝදය ම.ම.වි. - දිවුලපිටිය.

## විශ්ව සභා ඉතිහාසය (II)
## අ. පො. ස. (උ.පෙ.) ක්‍රිස්තියානි ධර්මය
මුල් අපෝස්තලික සමය (3 වන සියවස අවසානය දක්වා)
ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි.

### කිතුනුවන්ට එරෙහි ජුදා පීඩනය

ක්‍රිස්තුස් වහන්සේගේ සුබාරංචිය ජුදයාව, සමාරිය, ගලීලය ආදී බොහෝ ප්‍රදේශවල ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. එය අදහාගත් අය අතර ජුදාවරු මෙන්ම අන්‍ය ජාතිකයෝද සිටියහ. ජුදා දහම ඇදහූ අයගෙන් පිරිසක් පසුව ක්‍රිස්තියානි දහම වැළඳ ගැනීම දැඩි ආගම්වාදී ජුදාවරුන්ගේ විරෝධයට ලක් විය. එනිසා ජුදා දහම ඇදහූ ජුදාවරු ක්‍රිස්තියානි දහම වැළඳගත් ජුදාවරුන්ට පීඩා කළහ.

එසේම ජුදා ජනතාව බලාපොරොත්තු වූයේ දාවිත් රජු මෙන් බලසම්පන්න තම ජනතාවට විමුක්තිය ගෙන දෙන රජෙකි. එනිසා වඩුවකුගේ පුතෙකු ලෙස බිහිවූ ක්‍රිස්තුස් වහන්සේව මෙසියස් ලෙස පිළිගැනීම ඔවුහු ප්‍රතික්ෂේප කළා පමණක් නොව ක්‍රිස්තුස් වහන්සේව අදහන, පිළිගන්නා හැම දෙනාටම ජුදා පීඩනයට මුහුණ දීමට සිදුවිය. ඒ අවස්ථාවේදී කිතුනුවන්ට පීඩා කිරීමට පාවුලු ද එක් විය. ශුද්ධවූ ස්තේපන් තුමා ප්‍රාණපරිත්‍යාගි විය (ක්‍රියා 7/54-60). එහි ප්‍රතිඵලය ලෙස ක්‍රිස්තු භක්තිකයෝ ජෙරුසලමෙන් පිටවී විසිරී ගොස් සැඟවුණහ. එලෙස සැඟවුණ අපෝස්තුලුවරු ඒ ඒ ප්‍රදේශවල සුබාරංචිය පතල කිරීමේ නිරතවූහ.

### පාවුලුගේ සිත් හැරීම

පාවුලු ක්‍රිස්තු භක්තිකයන්ට පීඩා කිරීමටත් ඔවුන් අත්අඩංගුවට ගැනීමටත් උත්තම පූජකගෙන් බලපත්‍රයක් ගත්තේය (ක්‍රියා 9/1-2). ඒ බලපත්‍රය ගත් පාවුලු ජෙරුසලමේ සිට දමස්කය බලා යමින් සිටි අවස්ථාවක ක්‍රිස්තුස් වහන්සේගේ හඬ ඔහු වෙත පැමිණ ඇත. එලෙස හදිසියෙන් බැබලුණු ආලෝකයක් ඔහු දිටීය. ක්‍රිස්තුස් වහන්සේ සාවුල්ගෙන් අසන්නේ "සාවුල් සාවුල් නුඹ මට පීඩා කරන්නේ මන්ද? යනුවෙනි" ඉන් පසුව ක්‍රිස්තුස් වහන්සේගේ සභාවට පීඩා කළ සාවුල් තමන්ගේ සිත් හැරීම තුළ ක්‍රිස්තියානි සභාව ගොඩනැඟීමට පියවර ගෙන ඇත. (සිත්හැරීමෙන් පසුව ඔහුගේ නාමය පාවුලු ලෙස වෙනස් විය.) එතුමා සුබාරංචිය දේශනා කරමින් ධර්මදූත සංචාර 3 ක් ගොස් ඇත. ඒ ගමන් වාර සම්බන්ධව අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ 13 සිට 20 දක්වා පරිච්ඡේද වෙන් කෙරේ. එතුමන්ගේ ධර්මදූත සංචාර ආරම්භ වන්නේ සිරියාවේ අන්තියෝකියේ සිටය.

### 1. ප්‍රථම ධර්මදූත සංචාරය

ඒ සංචාරය සිදුවී ඇත්තේ ක්‍රි.ව. 45-49 අතර කාලයේය. චාරිකාවට සහභාගි වූ අය වූයේ පාවුලු, බාර්නබස්, ජොහාන් මාර්ක් වැන්නන්ය. චාරිකාවේ අරමුණ අන්තියෝකිය සභාව තුළ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය සහ මඟපෙන්වීම තහවුරු කිරීමයි (ක්‍රියා 9/1-2). ඒ චාරිකාවේ දී පම්පිලියේ පර්ගාවේ විශේෂ සිදුවීමකි. එනම් පාවුලු සහ ජොහාන් මාර්ක් අතර විරසකයක් නිර්මාණය වීමය. ඒ හේතුවෙන් ජොහාන් මාර්ක් සංචාරය අතරතුරදී නැවත හැරී ජෙරුසලමට පැමිණ ඇත.

#### ජෙරුසලෙම් මන්ත්‍රණ සභාව (ක්‍රියා 15/1-21)

පාවුලු තුමාගේ ප්‍රථම ධර්මදූත සංචාරයෙන් පසුව විජාතික සභා වූ අන්තියෝකිය සභාව සහ ජෙරුසලෙම් සභාව අතර ගැටලු මතු විය. මතුවූ ගැටලු අතර ප්‍රධාන වශයෙන්

1. අන්තියෝකිය සභාවේ ගැටලු.
2. චර්මච්ඡේදනය අනිවාර්ය බවට මතුවූ අදහස්.
3. මොසෙස්ගේ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මතුවූ කරුණු.

ඒ ගැටලු නිරාකරණය කිරීමට ජෙරුසලම් මන්ත්‍රණ සභාව කැඳවන ලදි. මන්ත්‍රණ සභාවේ නායකත්වය ගන්නා ලද්දේ ජාකොබ් තුමන් විසිනි.

ක්‍රි.ව. 50 දි රැස්වන ලද ඒ මන්ත්‍රණ සභාව ජුදයේ ජෙරුසලෙම් නගරයේ පවත්වා ඇත. එය ක්‍රිස්තු ශාසනයේ ප්‍රථම මන්ත්‍රණ සභාව වූවත් ප්‍රථම ජගත් මන්ත්‍රණ සභාව ලෙස කිව නොහැකිය. (ප්‍රථම ජගත් මන්ත්‍රණ සභාව වන්නේ ක්‍රි.ව. 325 දී රැස්වූ පෙරදිග ප්‍රදේශයට අයත් නිසියා නගරයේ පැවැත්වූ සභාවයි.) පේදුරු, ජාකොබ්, පාවුලු, බාර්නබස් ඇතුළු ප්‍රේරිතයෝ සහ සභා මූලිකයෝ ජෙරුසලෙම් මන්ත්‍රණ සභාවට සහභාගී වූහ.

### මන්ත්‍රණ සභාව ගත් තීරණ

1. පවිත්‍ර කරනු ලබන්නේ චර්මච්ඡේදනයෙන් නොව ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇදහිල්ල මඟිනි.

2. ධර්මය සම්බන්ධව විජාතීන්ට හිරිහැර නොකිරීම සහ රූප සම්බන්ධ දූෂණවලින් වැළැකීම.

3. කාමමිථ්‍යාචාරයෙන් වැළැකී සිටීම.

4. බොටුව මිරිකා මැරූ සතුන්ගේ මස් කෑමෙන් හා රුධිර පානයෙන් වැළැකීම.

5. ගැලවීම ලබන්නේ ව්‍යවස්ථාව පිළිපැදීමෙන් නොව ක්‍රිස්තුස් වහන්සේ මඟින් බව පෙන්වා දීම.

ජෙරුසලම් මන්ත්‍රණ සභාව නිමා වීමෙන් පසුව එහිදී ගත් තීරණ අන්තියෝකිය සභාවට හා විජාතික සභාවලට දැනුම් දීමට යෝජනා විය. ඒ අනුව පාවුලු, බාර්නබස්, ජුදස් (බර්සබස්) හා සීලස් යන අය විජාතික සභාවලට පිටත් කර හරින ලදහ. ඒ සංචාරය පාවුලු තුමාගේ දෙවන ධර්මදූත ගමන වේ.

## 2. දෙවන ධර්මදූත සංචාරය

මේ සංචාරය සිදුවී ඇත්තේ ක්‍රි.ව. 49-52 අතර කාලයේය. චාරිකාවට සහභාගී වූ අය වන්නේ පාවුලු, සීලස්, තිමෝති සහ ලූක් යන්නන්ය. චාරිකාවේ අරමුණ වන්නේ ප්‍රථමයෙන් ඇතිකර ගන්නා ලද සභා නැවත බැහැදැකීම සහ ජෙරුසලෙම් මන්ත්‍රණ සභාවේ තීරණ ඇතුළත් ලිපිය සම්බන්ධව දැනුම් දීමයි (ක්‍රියා 15/30-38).

ඒ ධර්මදූත චාරිකාවද ආරම්භ වූයේ අන්තියොකියේ සිටය. එහිදි ආරම්භයට පෙර විශේෂ සිදුවීමකි. එනම් බාර්නබස්ගේ යෝජනාවකි. එනම් සංචාරයට ජොහාන් මාර්ක් කැඳවාගෙන යාමට බාර්නබස්ට අවශ්‍ය විය. එහෙත් පාවුලු තුමා එයට අකමැත්ත දැක්වීය. එහිදි දෙදෙනා අතර දැඩි විවාදයක් හටගැනිණ. එවිට බාර්නබස් පාවුලු ගෙන් ඉවත්වී ජොහාන් මාර්ක් සමඟ සයිප්‍රසය බලා පිටත් විය. පාවුලු එතුමාගේ සංචාරයට පිටත් විය.

## 3. තෙවන ධර්මදූත සංචාරය

මේ සංචාරය සිදුවී ඇත්තේ ක්‍රි.ව. 53-58 අතර කාලයේය. චාරිකාවට සහභාගී වූ අය වන්නේ පාවුලු, සීලස්, තිමෝතියස්, එරස්ටස් යන අයයි.

චාරිකාවේ අරමුණ වන්නේ පාවුලු තුමාගේ අවසාන කාලයේදී (එතුමා සිරගත වන බවත් තමන්ව මරා දමන බවත් එතුමා පෙර සිට දැනගෙන සිටින්නට පුළුවන.) එතුමන් විසින් ස්ථාපිත කළ සභාවල වර්ධනය සම්බන්ධව සොයා බැලීමටත් ඒ සභා සාමාජිකයන් ධෛර්යවත් කිරීමටත්, අවසාන ආචාරය පුද කිරීමටත්ය. චාරිකාව නිමා කර එතුමා නැවත ජෙරුසලමට පැමිණියේය.

ජුදෙව්වන් පාවුලු තුමා හට බොරු චෝදනා ඉදිරිපත් කොට අත්අඩංගුවට පත් කෙරිණි. ඒ තත්ත්වය සම්බන්ධව කයිසාරියේ පිලිප්ගේ නිවසේදී දිවැසිවර අගබස් පාවුලු තුමාට සිදුවන්නට යන දේ ගැන පූර්ව දැනුම් දීමක් කර ඇත. අගබස් නැවත ජෙරුසලමට නොයන ලෙස පාවුලුගෙන් ඉල්ලා සිටියත් එතුමා ජෙරුසලමට යෑම තම වගකීම ලෙස සලකා එසේ කර ඇත. පාවුලු තුමා අත්අඩංගුවට පත් කරනු ලැබූවත් එතුමාගේ රෝම පුරවැසි භාවය හේතුවෙන් සෙන්හෙඩ්‍රින් සභාවට එතුමාට විරුද්ධව විනිශ්චය ලබා දිය නොහැකි විය. එනිසා එතුමා සම්බන්ධව තීරණයක් ගැනීමට රෝමයට පිටත් කර යවා ඇත. රෝමයට යන ගමනේදී මධ්‍යධරණී මුහුදේ ඇතිවූ කුණාටුවක් හේතුවෙන් නැව මුහුදුබත් වී පාවුලු ඇතුලු නෞකාවේ සෙසු අය මෝල්ටා දූපතට ගසා ගෙන යන ලදහ. මෝල්ටා දූපතේදී පාවුලු තුමා එහි වැසියන්ටද ධර්ම ප්‍රචාරය කර ඇත (ක්‍රියා 28/1-10).

ඒ ගමන නිමා වන්නේ රෝමයෙනි. රෝමයට ගිය පසු එතුමාට විරුද්ධව නඩු විභාගය පැවැත්විණි. එතුමා ගෙයක් කුලියට ගෙන වසර දෙකක් පමණ එහි නැවතී සිට ඇත. රෝම අධිරාජ්‍යයා ලෙස කටයුතු කළ නීරෝ රජු සමයේ පේදුරු හා පාවුලු තුමන්ලා ප්‍රාණපරිත්‍යාගි වූහ. රෝමානු අධිරාජ්‍යවරුන් ලෙස ජූලියස් සීසර්, අගෝස්තුස් සීසර්, තිබේරියස් සීසර්, ගායුස් කලිගුලා, ක්ලෝදියස්, නීරෝ යන අය මුල් කාලයේ කටයුතු කර ඇත්තාහ. නීරෝ අධිරාජ්‍යයාගේ පාලන සමය වූයේ ක්‍රි. ව. 54-68 කාලයයි. ක්‍රිස්තුස් වහන්සේ උපදින සමයේ අධිරාජ්‍යයා වූයේ අගෝස්තුස් සීසර්ය. ක්‍රිස්තුස් වහන්සේ කුරුස පත් කරන අවධියේ අධිරාජ්‍යයා වූයේ තිබේරියස් සීසර්ය.

### පාවුලු ලිපි වර්ගීකරණය

පාවුලු ලිපි වර්ගීකරණයේදී පාවුලු තුමා විසින් ලියන ලදැයි ප්‍රකාශවන හසුන් පත්‍ර 13 කි. ඒවා නව ගිවිසුමේ අන්තර්ගතවේ. ඒ යැවුම්පත්‍ර වර්ගීකරණයේදී

1. යැවුම්පත්‍ර ලියවී ඇති කාලය අනුව හා
2. කර්තෘත්වය අනුව වර්ගීකරණය වේ.

**කාලය අනුව වර්ගීකණය**

1. ක්‍රි.ව. 51-53 අතර කාලය 1,2 තෙසලෝනික ලිපි (02)
2. ක්‍රි.ව. 54-58 අතර කාලය 1,2 කොරින්ති, ගලාති, රෝම ලිපි (04)
3. ක්‍රි.ව. 61-63 අතර කාලය පිලිප්පි, එපීස, කොලොස්සි, පිලමොන් ලිපි (04)
4. ක්‍රි.ව. 65-67 අතර කාලය තීතස්, 1හා 2 තිමෝති ලිපි (03)

**කර්තෘත්වය අනුව වර්ගීකණය**


1. පාවුලු තුමා විසින්ම ලියා ඇති හසුන් පත්‍ර 1 තෙසලෝනි, ගලාති, පිලිප්පි, 1 හා 2 කොරින්ති, රෝම,පිලමොන් ලිපි (07)
2. වෙනත් ලේඛකයෙකු විසින් ලියා පාවුලු තුමාගේ නමට ආරූඪ කරන ලද හසුන් පත්‍ර 2 තෙසලෝනි, කොලොස්සි, එපීස ලිපි (03)
3. පාවුලු තුමාගේ මරණින් පසුව එතුමාගේ ශ්‍රාවකයන් ලියූවායයි සැලකෙන හසුන් පත්‍ර 1 හා 2 තිමෝති. තීතස් ලිපි (03) මේ හසුන් පත්‍ර ලියා ඇති සැලැස්ම දෙස බැලීමේදී ඉතාමත් ක්‍රමානුකුල ආකාරයකට ඒ ලිපිවල ආකෘතිය හැඩගැසී ඇත. ග්‍රීක රෝම සාහිත්‍ය අංග එම ලිපිවලින් උද්දීපනය කර ඇත. හැම ලිපියකම ආකෘතිය දෙස බැලීමේදී ලිපි 13 ටම පොදුවූ කරුණු 05 කි.

1. ප්‍රථමයෙන්ම ආමන්ත්‍රණයක් ඇත. - යවන්නාගේ සහ ලබන්නාගේ නම සඳහන් කරයි.
2. ආචාරයක්/සුබ පැතුමක් ඇත. - සාමය වේවා.
3. තුති පිදීමක් හෝ යාච්ඤාවක් ඇත. - කෙටි යැදුමක් කරයි.
4. අන්තර්ගතය හෙවත් පණිවුඩය - ඉගැන්වීම් හා අනුශාසනා ඇතුළත් කර ඇත.
5. අවසාන සුබ පැතුම - අවසානයේදි ප්‍රාර්ථනයක්/ආශිර්වාදයක් පිරිනමයි.

*හැම පාවුලු ලිපියක්ම ඉහත ආකෘතියට රචනා කර ඇත.*

සටහන

**ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**



## ආදරණීය දරුවනි

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සන නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි, සිතුවිලි
ආදී වශයෙන් ලබා ගැනීමට,
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
ඔබගේ භාරකරුගේ
දුරකතන අංකය සහ ලිපිනය ද
අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා.**
**"භක්ති ප්‍රබෝධනය"**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

BCI CAMPUS

Apply Now

විශ්වවිද්‍යාලය යනු හුදු භූමියක් නොව, අරුත්බර සිහිනයක සැබෑවීමක්, අපිරිමිත වූ අත්දැකීමක් මෙන්ම පුරා දේශයක අනාගතයේ හැඩතලය නිර්නය කරන්නා වූ කේන්ද්‍රස්ථානයක් ලෙස දැයට පිදීම අපගේ **අභිප්‍රායයි.**

2021 මාර්තු මාසයේදී ආරම්භ කිරීමට නියමිත ගෞරව උපාධි පාඨමාලා

- **තොරතුරු තාක්ෂණය**
  BSc in Information Technology (Hons)
- **ව්‍යාපාර කළමනාකරණය**
  Bachelor of Business Management (Hons)

UGC APPROVED



Aspire to Inspire

කතෝලික පරිසරයක සුරක්ෂිත අධ්‍යාපනය
Benedict XVI Catholic Institute

Your Dream Campus in NEGOMBO

දැන්ම අයදුම් කරන්න

www.bci.lk

Call Now 0312 035 100

# ආශිර්වාදලත් රෝමාණු කතෝලික විවාහයක්

## සඳහා විවාහ අපේක්ෂකයකු/අපේක්ෂිකාවක් සොයනා

## රෝමාණු කතෝලික ඔබ සඳහාම පමණක් වෙන්වූ

**විශ්වාසනීය, ක්ෂණික, තොරතුරු හා පෞද්ගලිකත්වයට උපරිම ආරක්ෂාවක් සහිත අසමසම ඩිජිටල් මොබයිල් ඇප් සේවාව**

# www.kithunu.com



**මෙම විවාහ අපේක්ෂක සේවාව ලබා ගත හැක්කේ මීසම් භාර පියතුමකු හරහා තහවුරු කරගත් රෝමාණු කතෝලික අය හට පමණි.**

සම්පූර්ණ කරන ලද සියලු ගිණුම් සඳහා දින 7ක ට්‍රයල් පැකේජ සේවාව නොමිලයේ හිමිවේ.

ඉන්පසු, කාලසීමාව (මාස 2, මාස 6 හෝ අවුරුදු 1) / සම්බන්ධතා ගණන මත පදනම් වූ පැකේජයක් සුලු ගාස්තුවක් ගෙවා මිලදී ගෙන සේවාව ඉදිරියටම පවත්වාගෙන යා හැක. සාර්ථකවූ විවාහ යෝජනා සඳහා හෝ අනෙකුත් කරුණු සඳහා හෝ සැඟවුනු අමතර ගාස්තු කිසිවක් නොමැත.

කතෝලික පූජකතුමන්ලාගේ/පැවිදි කන්‍යා සොහොයුරියන්, සහෝදරතුමන්ලා සහ දෙව්සත්හල්/කන්‍යාරාම වල පැවිදි දිවිය සඳහා සුදානම් වන්නාවු අයගේ විවාහ අපේක්ෂක සහෝදර/සහෝදරියන් හට මෙම සේවාව සම්පූර්ණයෙන්ම නොමිලයේ ලබා ගත හැක*.

PC / Laptop Version
https://app.kithunu.com

GET IT ON
Google play

0117-483-899

WhatsApp Only: +94 773-483-899

*වැඩි විස්තර සහ කොන්දේසි සඳහා අප අමතන්න.

Kithunu
Putting Faith Back Into Marriage

KithunuSriLanka
www.kithunu.com



"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගැරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. QD/81/පුවත්/2021


මිල රු.35/=
(සහන මිල)